
wijeya newspapers
Follow us on @lankadeepa | www.facebook.com /lankadeepa | subscribed :lankadeepa online | www.lankadeepa.lk

අඛණ්ඩවම 16 වසරක් ජනප්‍රියතම මහජන සම්මානයෙන් පිදුම් ලද දිනපතා ජාතික පුවත්පත

# ලංකාදීප

31 වැනි කාණ්ඩය | 257 වැනි පත්‍රය | පිටු 12 යි | විජය ප්‍රකාශනයක් | 2022 ජූලි මස 9 වැනිදා සෙනසුරාදා | මිල රුපියල් 50.00 යි

## අර්බුදයට විසඳුම් ලබා සිටිද්දී විපක්ෂය ජනතාව නොමඟ යවනවා



ජනාධිපති මාධ්‍ය අංශයෙන් නිවේදනයක්

6 පිටුව බලන්න

# තෙල් පෝලිම තරුණ ඉංජිනේරුවා බිලිගනී



## පහරදී කපා කොටා මරලා: 8 ක් අත්අඩංගුවට - 3 ක් රෝහලේ

ගාල්ල, මාගාල්ල ඉන්ධන පිරවුම්හලට ඉන්ධන ලබා ගැනීම සඳහා පෝලිමේ සිටි දෙපිරිසක් අතර පෙරේදා (7) මධ්‍යම රාත්‍රියේ ඇති වූ ගැටුමකදී තියුණු ආයුධවලින් පහරදී විසිපස් හැවිරිදි තරුණ සිවිල් ඉංජිනේරුවකු ඝාතනය කර ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නීතිඥ නිහාල් තල්දූව මහතා පැවසීය.

එම ගැටුමේදී තවත් පුද්ගලයන් තිදෙනකු තුවාල ලබා කරාපිටිය රෝහලට ඇතුළත් කර ඇති බව ද ඔහු සඳහන් කළේය.

(විස්තර වාර්තාව 9 වැනි පිටුවේ)

8 වැනි පිටුවට

## බස්නාහිර පොලිස් කොට්ඨාස 7කට ඇඳිරිය

CURFEW

2 පිටුව බලන්න

## ජපාන හිටපු අගමැති අබේ ජනරැලියක් අමතද්දී වෙඩිතබා මරයි



### වෙඩික්කරු හිටපු සෙබළෙක්

ටෝකියෝ නුවරදීය (ඒ.එෆ්.පී.)


ජපානයේ හිටපු අග්‍රාමාත්‍ය ෂෙන්සෝ අබේ මහතා වෙඩි තබා ඊයේ (08) ඝාතනය කරනු ලැබීය. හිටපු අග්‍රාමාත්‍යවරයා ඝාතනය කෙරුණේ නාගා නගරයේ ජනතා රැලියකට සහභාගී වෙමින් ජනතාව අමතද්දීය.

8 වැනි පිටුවට



සැහසිකයා අල්ලාගත් අවස්ථාව...

## විරෝධතාවලදී ප්‍රචණ්ඩත්වය එපා



ඇමෙරිකානු තානාපතිනිය ඉල්ලයි

■ විමුක්ති එස්. රුද්‍රිගු

විරෝධතා පැවැත්වීමේදී ප්‍රචණ්ඩත්වයෙන් තොරව සාමකාමීව විරෝධතා පවත්වන ලෙස සියලු පාර්ශ්වයන්ගෙන් ඉල්ලීමක් කරන බව ශ්‍රී ලංකාවේ ඇමෙරිකානු තානාපති ජුලී චන්ග් මහත්මිය ප්‍රකාශ කළාය.

ශ්‍රී ලංකාව මුහුණ දී තිබෙන ආර්ථික අර්බුදයට විසඳුම ප්‍රචණ්ඩත්වය නොවන බවද ජුලී චන්ග් මහත්මිය පැවසුවාය.

8 වැනි පිටුවට

## නාමල්ගේ බිරිය - පුතා ප්‍රංශයට

6 පිටුව බලන්න

## 1 ශ්‍රේණියට ගැනීම: අයැදුම් කැඳවීම අගෝ: 1 ට දික්කරයි

## අන්තරේ පා ගමනට ජල - කඳුළු ගෑස්

■ ඉන්දිකා රාමනායක

ජනාධිපතිවරයා සහ අගමැතිවරයා ප්‍රමුඛ රජයට විරෝධය දක්වමින් අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය කැලණිය විශ්වවිද්‍යාලය ඉදිරිපිටින් ඊයේ (8) ආරම්භ කළ විරෝධතා පාගමනට පොලිසිය කොටුව ලංකා බැංකු මාවතේදී ජල හා කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කර විසුරුවා හැරීය.


එම මාර්ගය අවහිරකරමින් දමා තිබූ මාර්ග බාධක බිඳගෙන සිසුන් ඉදිරියට ගමන් කිරීමට සූදානම් වූ අවස්ථාවේදී එය වළක්වාලමින් පොලිසිය ජල හා කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කරමින් පිරිස විසුරුවා හැරීමට පියවර ගත්තේය.



පොලිසියෙන් අන්තරේ සිසුන්ට කඳුළු ගෑස්-ජල ප්‍රහාර එල්ල කළ අයුරු.

■ ඡායාරූපය - හිමත් මතීෂ

## හජ් උත්සවය හෙට



ලොව පුරා ඉස්ලාම් බැතිමතුන් මහත් බැතියෙන් සමරන හජ් උත්සවය හෙටට (10) යෙදී ඇත.

ඉස්ලාම් දහමට අනුව ලොව මුල්ම මිනිසා ලෙස සැලකෙන නබිතුමන්ගේ කැපකිරීම් හා පරිත්‍යාගය සපිරුණු සිදුවීම් මූලික කරගනිමින් මෙම දිනය සමරනු ලැබේ.

(විශේෂ ලිපියක් 5 වැනි පිටුවේ)


## අන්තරේ විරෝධතාවට ඉල්ලූ තහනම උසාවිය ඉවතදමයි

■ නිමන්ති රණසිංහ

අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ ශිෂ්‍යයන් පිරිසක් කුරුඳුවත්තේ සිට අද (09) ආරම්භ කිරීමට නියමිත විරෝධතාවක් හේතුවෙන් මහජන පීඩාවක් ඇති වන බැවින් ඔවුන් එම ප්‍රදේශයේ මාර්ග කිහිපයකට ඇතුළුවීම වළකාලමින් ආඥාවක් නිකුත් කරන ලෙස කුරුඳුවත්ත පොලිසිය කළ ඉල්ලීමක් කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් නන්දන අමරසිංහ මහතා ඊයේ (08) ප්‍රතික්ෂේප කළේය.

8 වැනි පිටුවට

## දුම්රිය ගාස්තු 12 දා සිට සියයට 130 කින් නඟී



අවම ගාස්තුව 20 ක්

6 පිටුව බලන්න

පණ්කජ රුවින්දගේ සරදම



තෙල් නැතිව මන්ත්‍රීවරු 50 ක් ගමේ හිරවෙලාලු!

ඇයි අපි විතරද බයිසිකල්වලින්, ගොන් කරත්තවලින් යන්න ඕනෑ?

## අයි.ඕ.සී. තෙල් බෙදීම අත්හිටුවයි

සඳුදා සිට යළිත්

IOC

6 පිටුව බලන්න

## ජනපති ප්‍රමුඛ ආණ්ඩුව යනු: විරෝධතාව අද කොළඹදී

සජබ - ශ්‍රීලනිප - ජවිපෙනුත් සහාය

■ ඩයනා උදයංගනී, නිමල කොඩිතුවක්කු සහ මුදිතා දයානන්ද

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ප්‍රමුඛ ආණ්ඩුව වහා ඉවත්විය යුතු බවට බලකරමින් කොළඹදී අද (09) විරෝධතාවක් ආරම්භ කරන බව ගාලුමුවදොර සර්වපාක්ෂික අරගලකරුවෝ පවසති.

8 වැනි පිටුවට

## කළුතර පොහොට්ටු මන්ත්‍රී පින්කම් ගෙදරදී අහසට වෙඩිතබා පලාගිහින්



■ පානදුර සුමිත් පොතුපිටිය සහ බණ්ඩාරගම බිමල් ශ්‍යාමන් ජයසිංහ

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ලලිත් වර්ණකුමාර මහතා ඊයේ (08) අලුයම හොරණ, දොඹගොඩ ප්‍රදේශයේ නිවසක් ඉදිරිපිටදී අහසට වෙඩිතබා පලාගොස් ඇති බවට ලද තොරතුරක් ඔස්සේ අඟුරුවාතොට පොලිසිය පරීක්ෂණ ආරම්භ කර ඇත.

දොඹගොඩ නිවසක මියගිය තැනැත්තියකගේ තෙමස් පූර්ණ පින්කමක් පෙරේදා (07) රාත්‍රියේ පැවැත්වී ඇති අතර, ඒ සඳහා ලද ආරාධනයකට අනුව මන්ත්‍රීවරයාද සහභාගී වී ඇතැයි පැවැසේ.

8 වැනි පිටුවට

## කුකුළුමස් බිත්තර තව මාස 3 කින් නෑ

කුකුළු කොටු බාගයක් වැහිලා සංගම් සභාපති

6 පිටුව බලන්න

# පරිත්‍යාගයට මුල්තැන දෙන හජ් උත්සවය



**ඉස්ලාම් ධර්මයේ ප්‍රධාන අනිවාර්ය වගකීම් පහෙන් පස්වන හෙවත් අවසන් වගකීම වන හජ් වන්දනය ඉටු කිරීමෙන් පසුව හජ් උත්සවය ලොව පුරා වෙසෙන කෝටි සංඛ්‍යාත ඉස්ලාමීය බැතිමත්හු හෙට (10) දිනයේදී සමරති. මෙම ලිපිය පළවන්නේ ඒ නිමිත්තෙනි.**

ඉස්ලාම් ධර්මය ලොවට බිහි වන්නේ ඉස්ලාමය අනුව ලොව මුල්ම මිනිසා ලෙස සැලකෙන ආදම් නබි තුමන්ගෙනි. ලොව මුල්ම මිනිසා වූ ආදම් තුමන්ම වක්තෘවරයකු හෙවත් මග පෙන්වන්නකු ලෙස දෙවියන් වහන්සේ විසින් තෝරා ගනුලැබ සිටියේය.

නබි ආදම් තුමන්ගෙන් පසු කාලයේ බිහි වූ නබිවරු විශාල පිරිසක් තම තමන්ගේ සමාජය යහමඟට යොමු කරවීම සඳහා සිය වගකීම් ඉටු කළහ. එම වක්තෘවරුන් අතුරින් නබි ඉබ්‍රාහිම් තුමන්ට ඉස්ලාමයේ හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. ලොව පුරා වෙසෙන මුස්ලිම් ජනතාව සමරන හජ් උත්සවයට සම්පූර්ණයෙන් පාදක වන්නේ නබි ඉබ්‍රාහිම් (ඒබ්‍රහම්) තුමන්ගේ ජීවිත කාලයේ සිදු වූ ත්‍රාසය සහ පරිත්‍යාග රැසකින් සපිරිණු සිදුවීම් වෙයි.

ලෝකයේ සියලු මුස්ලිම් ජනතාව සිය වැඳුම් පිදුම් කරනු ලබන්නේ මක්කා නගරයේ පිහිටි ශුද්ධ වූ කහ්බා දේවස්ථානය දෙසට සිය මුහුණු යොමු කරවමිනි. අල්ලාහ් දෙවියන් වහන්සේ විසින් දේව දූතයන් මගින් මෙම දේවස්ථානය මක්කා නගරයේ බිහි කරනු ලැබූ බව ඉස්ලාමය සඳහන් කරයි. නබි ඉබ්‍රාහිම් තුමන්ගේ කාලයේදී එතුමන්ගේ පුත් නබි ඉස්මායීල් තුමන්ද එක්ව කහ්බතුල්ලා දේවස්ථානය ප්‍රතිසංස්කරණය කළ බවද ඉස්ලාමය කියයි.

ලොව පුරා වෙසෙන කෝටි සංඛ්‍යාත මුස්ලිම් බැතිමතුන් මක්කා නගරයට ගොස් හජ් වන්දනය ඉටු කිරීමේ ප්‍රධාන ආගමික වතාවත් සිදු කරනු ලබන්නේ මෙම කහ්බා දේවස්ථානයේ වීම විශේෂත්වයකි.

ලොව මුල්ම මිනිසා වූ ආදම් තුමන්ගෙන් ඇරඹෙන ඉස්ලාම් ධර්මය පරිපූර්ණ කරන්නේ මුහම්මද් නබි තුමාණන්ගෙනි. මුහම්මද් නබි තුමානෝ විසින් මුස්ලිම් ජනතාව අනිවාර්යයෙන්ම ඉටු කළ යුතු වගකීම් පහක් හඳුන්වා දුන්හ. අල්ලාහ් දෙවියන් වහන්සේ සහ නබි මුහම්මද් තුමන් විශ්වාස කිරීම එහි පළමුවැන්න වන අතර පස්වේල් සලාතය ඉටු කිරීම, රමලාන් මාසයේ පුරා මාසයක උපවාසය සුරැකීම, තමන් සතු දේපළින් සියයට දෙක හමාරක දුගී බද්ද ලබා දීම සහ හජ් වන්දනය අනෙකුත් ප්‍රධාන වගකීම් වෙයි.

මෙම ප්‍රධාන වගකීම පහෙන් හජ් වන්දනය අවසන් වගකීම් වන අතර එය ඉටු කිරීම සඳහා සවුදි අරාබියේ මක්කා සහ මදීනා නගරවලට ගොස් ඉටුකිරීම සඳහා අවශ්‍ය ආර්ථික හැකියාව තිබෙන අයට පමණක් මෙම වගකීම අනිවාර්ය වේ. එසේ නොමැති අයට තමන්ගේ රටේ සිටම හජ් උත්සවය සැමරිය හැකිය.

නබි ඉබ්‍රාහිම් තුමන්ගේ සහ නබි ඉස්මායිල් තුමන්ගේ පරිත්‍යාග රැසක් සිහිපත් කරවන හජ් උත්සවය මුස්ලිම් ජනතතාව සමරන්නේ මහත් භක්තියෙන් වීම විශේෂත්වයකි.

හජ් උත්සවය පැවැත්වෙන දින අළුයම නැගිටින මුස්ලිම් බැතිමතුන් දිය නා පිරිසුදුව නව ඇඳුම් ඇඳ ආගමික වතාවත් ඉටු කිරීම මෙහි මූලික අංග වෙයි. ඉන් පසුව තම තමන්ගේ ඥතීන් අසල්වාසීන් සමඟ එක්වී ආහාර අනුභව කිරීම සිදු කරනු ලබයි. හජ් උත්සවයේ මූලික කටයුතු එතැනින් අවසන් වෙයි.

**සටහන - මොහොමඩ් ආසික්**

එසේ වුවද මක්කා නගරයට ගොස් හජ් වන්දනය ඉටු කිරීම සඳහා දින 10 කට වැඩි කාලයක් අවශ්‍ය වන අතර ඒ සඳහා විශේෂිත වැඩපිළිවෙළක්ද වෙයි. කෙසේ නමුත් වර්තමානයේ ලෝකයෙත් අපේ රටෙත් පවතින තත්ත්වය මත හජ් වන්දනය ඉටු කරන පිරිස ඉතා අඩු මට්ටමක පවතින අතර ඒවා නිසි පරිදි ඉටු කිරීමේ හැකියාවක්ද නොමැති බව පෙනී යයි.

හජ් වන්දනයේ ප්‍රධාන අංගයක් ලෙස උල්හියියා නමින් හඳුන්වන සත්ව දනය හැඳින්විය හැකිය. නබි ඉබ්‍රාහිම් තුමන්ගේ පුත් ඉස්මායිල් කුමරුන්ව දෙවියන් වහන්සේ වෙනුවෙන් දන් දෙන ලෙස ලැබුණු දේව අණක් අනුව එක්තරා පර්වතයක් ආසන්නයේ නබි ඉබ්‍රාහිම් තුමන් ඒ සඳහා සූදනම් වෙමින් සිටියදී එම ස්ථානයට සුදු පැහැති එළුවකු එවා දෙවියන් වහන්සේ කළ හාස්කම සිහි ගන්වමින් මෙම සත්ව දනය සිදු කරනු ලබයි. මෙම දනය සඳහා ඔටුවන් එළුවන් ගවයන් වැනි සතුන් යොදා ගන්නා අතර ඒ ඒ රටවල පවතින තත්ත්වය අනුව මෙම සත්වයන් යොදා ගනු ලබයි. ඉස්ලාම් ධර්මය සත්ව ඝාතනය අනුමත කර ඇතත් අනිවාර්ය කර ඇත්තේ වසරකට දින තුනක් පමණක් වෙයි.

හජ් වගකීම් ඉටු කිරීම සඳහා මක්කා නගරයට යන මුස්ලිම් ජනතාව එහිදී අනෙකුත් වගකීම් සමඟ මෙම උල්හියියා හෙවත් සත්ව දනය ද ඉටු කළ යුතුය. මෙයින් අදහස් වන්නේ ආහාර හිඟයෙන් පෙළෙන ජනතාව වෙත සත්ව මාංශ ආහාර සඳහා ලබා දීමයි. අපේ රටේද යමක් කමක් ඇති මුස්ලිම් බැතිමත්හු මෙම දනය සිදු කරනු ලබයි.

ඉබ්‍රාහිම් නබි තුමන්ගේ කාලයේ එතුමන්ට විඳින්නට සිදු වූ අනේක විද දුක් ගැහැටවලින් පසුව එතුමන් මොලොවට බොහෝ දෑ දයාද කළහ. එයින් එකක් ලෙස මෙම හජ් වන්දනය සහ ඒ ආශ්‍රිත සිද්ධි සඳහන් කළ හැකිය. ලොව පුරා මුස්ලිම් ජනතාවත් සමඟ එක්ව ඊදුල් අල්හා හජ් උත්සවය සමරන සියලු බැතිමතුන් හට ඊද් මුබාරක්.

**සුබ හජ් උත්සවයක් වේවා.**

# මහජන උපයෝගිතා කොමිසමේ සභාපතිගේ ගණන් හිලව් වැරැදියි

## - තෙල් සංස්ථාවෙන් නිවේදනයක්

**ලංකා ඛනිජ තෙල් සංස්ථාව පිරිපහදු කළ ඛනිජ තෙල්වල ආනයනික පිරිවැය වැරදි ලෙස ගණනය කර ඇති බවට මහජන උපයෝගිතා කොමිසමේ සභාපතිවරයා පසුගියදා කළ ප්‍රකාශය මිල ගණන් පිළිබඳව සම්පූර්ණ කරුණු අධ්‍යයනයකින් තොරව කළ ප්‍රකාශයක් බවත් මහජන උපයෝගිතා කොමිසමේ සභාපතිවරයා ඒ සඳහා තාවකාලික රේගු සටහන්කරයේ මිල පාදක කරගෙන ඇති බවත් ලංකා ඛනිජ තෙල් සංස්ථාව නිවේදනයක් නිකුත් කරමින් පවසයි.**

එම නිවේදනයේ මෙසේද සඳහන් වේ.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පිරිපහදු කළ ඛනිජ තෙල් ආයතනය සඳහා වන පිරිවැය නිවැරදි නොවන බවට ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ සභාපති විසින් 2022.07.07 දින පැවැති මාධ්‍ය සාකච්ඡාවේදී ප්‍රකාශ කර ඇති අතර එම ප්‍රකාශය ඛනිජ තෙල් මිල ගණන් පිළිබඳව සම්පූර්ණ කරුණු අධ්‍යයනයකින් තොරව සිදු කර ඇති බව දැන්වීමට කැමැත්තෙමු.

ඉන්ධන නෞකාවක් මෙරටට පැමිණීමෙන් පසු ඒ සඳහා ආනයනික බදු ගෙවීමේදී නිශ්චිත සිංගප්පූරු ප්ලැට්ස් මිල (Singapore Platts price) අගයන් ප්‍රකාශිත නොවීම හේතුවෙන් මිලෙහි නාමික අගයක් යටතේ තාවකාලික රේගු සටහන්කරයක් ඉදිරිපත් කර අදළ බදු මුදල් ගෙවීමෙන් පසු ඉන්ධන තොගය ගොඩබානු ලබයි. පසුව ඉන්ධන තොගයට අදළ ප්ලැට්ස් මිල ගණන් ප්‍රකාශිත වූ පසු එයට අදළ නාවුක ලියකියවිලි බැංකු පද්ධතිය මගින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ලැබුණු විට අවසන් රේගු සටහන්කරය සකස්කර සත්‍ය අගය මත හිඟ මුදල් ශ්‍රී ලංකා රේගුව වෙත ගෙවීම් කරයි. මෙය ඛනිජ තෙල් ආනයනයේදී පෙර සිටම සිදු කරනු ලබන ක්‍රියාදමය වේ.

මෙහිදී තාවකාලික රේගු සටහන්කරය සහ අවසන් රේගු සටහන්කරය සකස්කර හිඟ මුදල් ගෙවීම සඳහා නාවික ලිපිගොනු බැංකු පද්ධතිය හරහා ලැබීමට දළ වශයෙන් මාස 02 ක පමණ කාලයක් වැය වේ. ඒ අනුව මෙම අදළ නැව් තොගවල මිල ගණනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහජන අපයෝගීතා කොමිෂන් සභාවේ සභාපති විසින් පාදක කොට ගෙන ඇත්තේ තාවකාලික රේගු සටහන්කරයේ මිල වේ.

මෙහිදී ඛනිජ තෙල් මිල සූත්‍රය සැකසීමේදී ආනයනික පිරිපහදු කළ ඛනිජ තෙල්වල ඇස්තමේන්තුගත පිරිවැය ගණනය කරනු ලබන්නේ පසුගිය ආසන්නතම මාසයක කාලය තුළ ප්‍රකාශිත සිංගප්පූරු ප්ලැට්ස් මිලෙහි සාමාන්‍ය අගය පදනම් කරගෙනය.

රට තුළ පවතින සමාජ, ආර්ථික දේශපාලනික වාතාවරණය තුළ ප්‍රකාශ නිකුත් කිරීමේදී රාජ්‍ය නිලධාරියකු වශයෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ සභාපති අදළ ආයතන සමග ලිඛිත කරුණු විමසීමකින් තොරව අදහස් ප්‍රකාශ කිරීම මගින් මහජනතාව නොමඟ යැවීමක් සිදුවන අතර මෙහි සත්‍යතාව පිළිබඳව අදළ ආයතන තුළින් තහවුරු කරගත යුතුව ඇත.

තවද, ඔහු විසින් ප්‍රකාශ කරන මිලගණන් අනුව ලොව අවම මිලට ඉන්ධන අලෙවි කරන රට බවට ශ්‍රී ලංකාව පත්විය යුතු බවත්, ශ්‍රී ලංකාවට තෙල් අපනයනය කරන රටවලටත් වඩා මෙරට තෙල් මිල අඩුවිය යුතු බවට වන ඔහුගේ මතයේ ගම්‍ය වේ.

මේ පිළිබඳ වැඩි විස්තර ලබාගැනීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල් හෝ ඔහුගේ නියෝජිතයකු සම්බන්ධ කර ගන්නා මෙන් ඉතා කාරුණිකව දන්වා සිටිමු.

# සාමකාමී අරගලයට එජාපය නිරතුරුව සහාය දෙනවා

## - නි. නායක රුවන් විජයවර්ධන කියයි

■ අංජුල මහික වීරරත්න

**සාමකාමී අරගලයට එක්සත් ජාතික පක්ෂය නිරතුරුවම සහය දෙන බව එක්සත් ජාතික පක්ෂ නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන මහතා පවසයි.**

අරගලකරුවන් අද (09) දිනයේ කොළඹට පැමිණ ජනාධිපතිවරයා ධුරයෙන් ඉවත් කිරීම ඇතුළු කරුණු මුල්කර ගනිමින් අඛණ්ඩ අරගලයක නිරතවීමට තීරණය කර ඇති බවත් ගාලුමුවදෙර අරගලකරුවන්ට මැයි 09 දින එල්ල වූ ප්‍රහාරයේදී ද එජාපය පෙනී සිටියේ අරගලකරුවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් බවත් විජයවර්ධන මහතා කියයි.

අරගලය වෙනුවෙන් මාධ්‍ය හමුවේ ප්‍රකාශයක් කරමින් රුවන් විජයවර්ධන මහතා මෙසේද කීය.

එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා අගමැති ධුරයට පත්වූ පසු අරගලකරුවන් සමඟ සාකච්ඡා කරමින් ඔවුන් සමග සම්බන්ධීකරණ කටයුතු වෙනුවෙන් පත් කරනු ලැබුවේ මායි. පවතින ආර්ථික අර්බුදය හමුවේ ජනතාව දැඩි පීඩනයකින් සිටින බව අප පිළිගන්නා පරම සත්‍යයක්. රාජපක්ෂ පාලනය හමුවේ රටේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම කඩා වැටුණේ වැරදි මූල්‍ය කළමනාකරණය නිසාවෙන්.

එම වැරදි මූල්‍ය පාලනයේ ප්‍රතිඵල අද භුක්ති විඳීමට සිදුව ඇත්තේ සමස්ත රට වැසියාටමයි. රනිල් වික්‍රමසිංහ මහතා අගමැති ධුරයට පත්වීමෙන් අනතුරුව පවතින ආර්ථික අර්බුදයේ සැබෑ තත්ත්වය රටට හෙළි කළා. අමාරු කාලයක් පසු කිරීමට සිදුව ඇති බව ද ප්‍රකාශ කළා. එම අමාරු කාලය දැන් අප පසුකරමින් සිටිනවා.

අරගලය වෙනුවෙන් කොළඹට පැමිණෙන ජනතාවගෙන් අපි ඉල්ලා සිටින්නේ එක දෙයක් පමණයි. ඒ සාමකාමීව විරෝධතාවයේ නිරත වන ලෙසටයි. විරෝධය පළ කිරීමට ජනතාවට ඇති මූලික අයිතිවාසිකම් අපි පිළිගන්නවා. සාමකාමී විරෝධතාවන්ට කිසිදු බාධාවක්, අවහිරයක් නොමැතිව නිදහසේ කරගෙන යාමට අවස්ථාව ද තිබිය යුතුයි. විරෝධතාවට පැමිණෙන ජනතාව ද සිය විරෝධය සාමය කඩනොවන අයුරින් පවත්වාගෙන යා යුතු බව අපගේ විශ්වාසයයි.

ආරක්ෂක අංශ ද නීතිය හා සාමය රැකිය යුත්තේ අරගලකරුවන්ට බාධාවක් නොවන ලෙසටයි. රාජ්‍ය දේපළ ආරක්ෂා කිරීම ආරක්ෂක අංශ සතු වගකීමක් සේම අරගලකරුවන් සතු වගකීමක් බව ද සිහිපත් කරනවා. සාමකාමී රටක් පැවැතීම අප සැමගේම අපේක්ෂාව වන බැවින් එය සැමද පවතීවා යන්න අපගේ ඒකායන ප්‍රාර්ථනයයි. යනුවෙන් ද රුවන් විජයවර්ධන මහතා සඳහන් කළේය.

# ඉන්දියාවේ යූරියා නැවක් අද දිවයිනට

■ අංජුල මහික වීරරත්න

**ඉන්දියාවෙන් ලැබෙන යූරියා පොහොර මෙට්‍රික් ටොන් 65,000න් පළමු තොගය වන මෙට්‍රික් ටොන් 40,000ක් රැගත් MV-ELEEN ARMONIA නෞකාව අද (9) රාත්‍රියේ කොළඹ වරායට පැමිණීමට නියමිතය.**

මෙම පොහොර ගොවීන්ට ලබාදීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සැකසීම සඳහා කෘෂිකර්ම අමාත්‍ය මහින්ද අමරවීර මහතා සහ සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් අතර සූම් තාක්ෂණය ඔස්සේ සාකච්ඡාවක් පැවැත්වුණු අතර එහිදී පොහොර බෙදහැරීම අධීක්ෂණය කිරීම සඳහා මැදිහත්වන ලෙස සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්ට දැනුම් දුන්නේය.


යූරිය පොහොර තොගය බෙදහැරීමේ කටයුතු මෙම 10 වැනිදා සිට ඇරඹීමට නියමිතය.

මෙම සාකච්ඡාවට අමාත්‍යාංශ ලේකම් රෝහණ පුෂ්පකුමාර මහතා ඇතුළු අතිරේක ලේකම්වරුද සහභාගි වී සිටියහ.

# ලංගම වැඩ වැරුම අවසන්

■ යොහාන් භාසුර

**සේවයට වාර්තා කිරීමට ඉන්ධන ලබාදෙන ලෙස ඉල්ලමින් ලංකා ගමනා ගමන මණ්ඩලයේ (ලංගම) සේවකයන් ඊයේ (8) දහවල් ආරම්භ කළ වැඩවර්ජනය අවසන් කළ බව සමස්ත ලංකා ප්‍රවාහන සේවක සංගමයේ ප්‍රධාන ලේකම් සේපාල ලියනගේ මහතා ඊයේ (18) පස්වරුවේ පැවසීය.**



ප්‍රවාහන අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා සමග අද පස්වරුවේ පැවැති සාකච්ඡාවේදී ලංගම සේවකයන්ට ඉන්ධන ලබාදීමට අමාත්‍යවරයා පොරොන්දු වූ බවත් එම පොරොන්දුව පිළිබඳව විශ්වාසය තබා වැඩවර්ජනය අවසන් කළ බවත් සේපාල ලියනගේ මහතා වැඩිදුරටත් කීය.

# පේරාදෙණිය-හම්බන්තොට උද්භිද උද්‍යානවල ආදායම බැහැලා

■ පේරාදෙණිය කුමාර රම්බොඩගෙදර

**ශ්‍රී ලංකාවේ ප්‍රධාන උද්භිද උද්‍යානය වන පේරාදෙණිය උද්භිද උද්‍යානයේ ආදායම පසුගිය මාසවල සියයට 10 දක්වා පහත වැටීම නිසා සේවක වැටුප් ගෙවීමට මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබාගැනීමට සිදුව ඇතැයි උද්‍යාන අධ්‍යක්ෂක ජෙනරාල් ආචාර්ය ක්‍රිෂ්ණරාජා මහත්මිය පැවසුවාය.**

මෙම ගැටලුකාරී තත්ත්වයට පෙර සාමාන්‍ය දිනක පේරාදෙණිය උද්භිද උද්‍යානය නැරඹීම සඳහා දේශීය හා විදේශීය සංචාරකයන් 6000 පමණ සංඛ්‍යාවක් පැමිණි අතර මේ දිනවල එම සංඛ්‍යාව 500 දක්වා පහත වැටී ඇත. සාමාන්‍ය මාසවල මිලියන 60ක පමණ ආදායමක් ඉපයූ පේරාදෙණිය උද්භිද උද්‍යානය මේ දිනවල මාසික ආදායම මිලියන 10 දක්වා අඩුවී ඇතැයි ඇය සඳහන් කළාය.

පේරාදෙණියට සාපේක්ෂව හම්බන්තොට උද්භිද උද්‍යානය නැරඹීමට පැමිණෙන සංචාරකයින් දිනකට දෙතුන් දෙනකු බවත් එම නිසා එහි ආදායම 100% ක්ම අහිමිවී ඇත. එම ප්‍රදේශයේ පවතින නියගය හේතුවෙන් තණකොළ සහ අනෙකුත් ගස් කොළන් සඳහා දිනපතා ජල බවුසර් පාවිච්චි කොට ජලය යෙදීමට සිදුව ඇති බැවින් විශාල මුදලක් වැය කිරීමට සිදුව ඇතැයි අධ්‍යක්ෂ ජෙනරාල්වරිය සඳහන් කළාය.

උද්භිද උද්‍යානවල නඩත්තු වියදම් වලින් වැඩි මුදලක් වැයවනුයේ තණකොළ කැපීම සඳහා වන අතර එම මුදල මාසිකව මිලියන 30ක් පමණ වන බවත් එම මුදල සම්පූර්ණ වශයෙන්ම වැයවනුයේ ඉන්ධන මිලදී ගැනීමට බැවින් මේ දිනවල පවතින ඉන්ධන හිඟය නිසා ඉන්ධන සඳහා වැයවන සම්පූර්ණ මුදල ඉතිරිව ඇතත් උද්භිද උද්‍යානය නඩත්තු කිරීම සිදු නොවීමෙන් එහි සුන්දරත්වයට බලපෑමක් සිදුව ඇතැයි අධ්‍යක්ෂ ජෙනරාල් ආචාර්ය ක්‍රිෂ්ණරාජා මහත්මිය වැඩිදුරටත් පැවැසුවාය.



1 වැනි පිටුවෙන්

# අර්බුදයට විසඳුම් ලබා සිටිද්දී විපක්ෂය ජනතාව නොමග යවනවා

## ජනාධිපති මාධ්‍ය අංශයෙන් නිවේදනයක්

**දේශපාලන අර්බුදයට සර්ව පාක්ෂික ආණ්ඩුවක් තුළ විසඳුම් සෙවීමට ජනාධිපතිවරයා සියලු දේශපාලන පක්ෂ නායකයන් සමඟ සාකච්ඡා කළද ඊට සාර්ථක ප්‍රතිචාර නොලැබීම නිසා රනිල් වික්‍රමසිංහ මහතාට අග්‍රාමාත්‍ය ධුරය බාරගෙන කටයුතු කිරීමට ඇරයුම් කළ බවත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ කළ සාකච්ඡා සාර්ථක වීම නිසා ඉදිරි සති කීපය තුළ ණය ආධාර වැඩසටහන ක්‍රියාත්මක වන පසුබිම නිර්මාණය වී ඇති බවත් ජනාධිපති මාධ්‍ය අංශ නිවේදනයක් නිකුත් කරමින් ඊයේ කියා සිටියේය.**

ඉන්ධන, ගෑස් සහ ඖෂධ ඇතුළු අත්‍යාවශ්‍ය භාණ්ඩ බෙදාහැරීමට සැලසුම් කර අවසන් බවත් පවතින තත්ත්වය දින කීපයක් තුළ විසඳන බවත් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පැවසූ බවද එම නිවේදනයේ සඳහන් වේ.

ජනාධිපති මාධ්‍ය අංශය ඊයේ (8) නිකුත් කළ නිවේදනයේ මෙසේද සඳහන් වෙයි.

වර්තමානයේ රට මුහුණ දෙන ආර්ථික අභියෝග ජයගෙන අපනයන හා කෘෂි ආර්ථිකයට ප්‍රමුඛතාව දෙමින් නව ආයෝජන සහිත ශක්තිමත් ආර්ථිකයක් ගොඩනැංවීම රජයේ අරමුණ විය. එහෙත් ලොවම මුහුණ පෑ කොවිඩ් වසංගත තත්ත්වය සියලු රටවල් දැඩි ආර්ථික අර්බුදයකට ගෙන ගොස් ඇත. ඉතාම ධනවත් රටවල් පවතින ආර්ථික අර්බුදයට විසඳුම් සොයමින් සිටී. එහිදී මුදල් සංචිතයක් නොමැති අප වැනි රටක ආර්ථිකයට එම තත්ත්වය ඉතා තදින් බලපායි.

මේ පසුබිම මත ඇති වූ දේශපාලන අර්බුදයට සර්වපාක්ෂික ආණ්ඩුවක් තුළ විසඳුම් සෙවීමට ජනාධිපතිතුමා සියලු දේශපාලන පක්ෂ නායකයන් සමඟ සාකච්ඡා කරනු ලැබීය. එහෙත් ඊට ලද ප්‍රතිචාර අසාර්ථක වීමත් සමඟ රනිල් වික්‍රමසිංහ මහතාට අග්‍රාමාත්‍ය ධුරය බාරගෙන කටයුතු කිරීමට ඇරයුම් කෙරිණ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාකච්ඡා ඉතා සාර්ථක වී ඇති අතර ඉදිරි සති කිහිපය ඇතුළත එම ණය ආධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසුබිම සැකසී තිබේ. පසුගිය සති කිහිපය තුළ රාජ්‍ය නායකයන් සමඟ දුරකථනය මගින් මෙන්ම බොහෝ රටවල තානාපතිවරුන් සමඟ සාකච්ඡා කර එම රටවල සහාය ගැනීමට කටයුතු කෙරිණ.

ඉතා සැලසුම්සහගත සහ දීර්ඝ වෑයමකින් පසු එහි ප්‍රතිඵල මේ වන විට රටට ලැබෙමින් පවතී.

අත්‍යාවශ්‍ය ඖෂධ තොග මේ වන විටත් ලැබී තිබේ.

ඉන්දීය ණය පහසුකම් යටතේ පොහොර මෙට්‍රික් ටොන් 65,000ක් ඇණවුම් කර තිබේ. එහි පළමු පොහොර මෙට්‍රික් ටොන් 44,000ක් රැගත් නෞකාව අද (09) දිවයිනට ළඟා වේ.

ඉන්ධන, ගෑස් සහ ඇණවුම් කළ අත්‍යාවශ්‍ය භාණ්ඩ ජූලි මස 12 වැනිද සිට අඛණ්ඩව ලැබීමට නියමිතය.

විවිධ කෘෂිකාර්මික වැඩසටහන් යටතේ රට තුළ ආහාර හිඟයක් ඇති නොවීමට සියලු කටයුතු යොදා ඇත.

21 වන සංශෝධනයට මේ වන විටත් කැබිනට් අනුමැතිය හිමිව තිබේ.

පැවති ගැටලුසහගත තත්ත්වයට සාර්ථක විසඳුම් ළඟා කර ගෙන ඇති මොහොතක විපක්ෂයේ දේශපාලන කණ්ඩායම් ජනතාව නොමග යවමින් ගෙන යන වැඩපිළිවෙළ ඉතා කනගාටුදායකය. මෙමගින් රට නැවතත් ආපස්සට ගමන් කරනු ඇත.

නිවැරදි ආර්ථික වැඩපිළිවෙළක් මගින් රටේ අනාගත දරු පරපුරට යහපත් රටක් ගොඩනැගීමට සහාය වීම ජනතාවගේ වගකීමක් හා යුතුකමකි. එම නිසා පවතින සැබෑ තත්ත්වය නිසිලෙස අවබෝධ කරගෙන වැරදි මතවාදයන්ට හසු නොවී සාමකාමීව හා බුද්ධිමත්ව කටයුතු කරන ලෙස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ජනතාවගෙන් ඉල්ලා සිටී.

# දුම්රිය ගාස්තු 12 වැනිදා සිට සියයට 130 කින් නගී

## අවම ගාස්තුව 20 ක්

■ යොහාන් භාසුර

**දුම්රිය ගාස්තු ලබන අඟහරුවාදා (12) සිට සියයට 130 කට ආසන්න ප්‍රතිශතයකින් ඉහළ දැමීමට දුම්රිය දෙපාර්තමේන්තුව තීරණය කර ඇත.**

එහිදී අවම ගාස්තුව රුපියල් 20 ක් දක්වා ඉහළ යන බව දුම්රිය දෙපාර්තමේන්තුවේ උසස් නිලධාරියෙක් 'ලංකාදීප'යට පැවසීය.

ගාස්තු ඉහළ දැමීමේ සැලැස්ම සකස් කර ප්‍රවාහන අමාත්‍යංශයේ ලේකම්වරයාට යොමු කර ඇති බව කී එම නිලධාරියා එම සැලැස්ම ගැසට් කිරීමෙන් පසුව බලාත්මක වන බව ද සඳහන් කළේය.

ඒ සඳහා වන නීතිමය ක්‍රියාපටිපාටිය මේ වන විට ක්‍රියාත්මක වෙමින් තිබෙන බවත් ලබන සඳුද වන එම කටයුතු අවසන්වනු ඇති බවත් එම නිලධාරියා කීවේය.

බස් ගාස්තුවෙන් අඩකට සමාන ප්‍රමාණයකින් දුම්රිය ගාස්තුව ඉහළ දැමීමට කැබිනට් මණ්ඩලය පසුගියද ලබාදුන් අනුමැතිය අනුව මෙම ගාස්තු ඉහළ දැමීම ක්‍රියාත්මක කර ඇති අතර සියලුම දුම්රිය මාර්ගවල තුන්වැනි පංතියේ ගාස්තුව ඇතුළු සියලුම ගාස්තු මේ අනුව ඉහළ යනු ඇත. රුපියල් 10 ක්ව පැවති අවම ගාස්තුව රුපියල් 20 ක් දක්වා ද ඉහළ දමා තිබේ.

# තෙල් රු. 250 ට ප්‍රකාශය

## කෝප් කමිටුවෙන් විමර්ශනයක්

■ සුජිත් හේවාජුලිගේ

**පෙට්‍රල් සහ ඩීසල් ලීටරයක් ජනතාවට රුපියල්250කට ලබාදිය හැකි බවට මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සභාපති ජනක රත්නායක මහතා කර ඇති ආන්දෝලනාත්මක ප්‍රකාශය සම්බන්ධයෙන් අදාළ සියලු පාර්ශව කැඳවා පුළුල් විමර්ශනයක් පැවැත්වීමට පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාව(කෝප් කමිටුව) තීරණය කර ඇත.**

මේ අනුව මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සභාපතිවරයා, විදුලිබල හා බලශක්ති අමාත්‍ය කංචන විජේසේකර මහතා සහ එම අමාත්‍යාංශයේ ප්‍රධානීන් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රධානීන් ලබන 12 වැනිද කෝප් කමිටුව හමුවට කැඳවන බව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය චරිත හේරත් මහතා පැවැසීය.

ජනක රත්නායක මහතා කර ඇති එම ප්‍රකාශය දැඩි ආන්දෝලනාත්මක එකක් වන හෙයින් ජනතාවගේ පැත්තෙන් බලා එහි ඇත්ත නැත්ත සෙවීම සඳහා තවදුරටත් විමර්ශන පැවැත්වීම අත්‍යවශ්‍ය කරුණක් බව කෝප් කමිටුවේ සාමාජිකයන් සියලු දෙනාගේ අදහස වී ඇතැයිද මහාචාර්යවරයා සඳහන් කළේය.

මේ අතර මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සභාපතිවරයා කර ඇති එම ප්‍රකාශය සම්බන්ධයෙන් තවදුරටත් විමර්ශන පවත්වා ජනතාවට සත්‍ය අනාවරණය කරන ලෙස විදුලිබල හා බලශක්ති ඇමැති කංචන විජේසේකර මහතා සිය ට්විටර් ගිණුමේ සටහනක් තබමින් පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවේ සභාපති මහාචාර්ය චරිත හේරත් මහතාගෙන් ඉල්ලීමක් කළේය.

තමාත් ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සභාපතිවරයාත් කැඳවා මේ ගැන විමර්ශනයක් පවත්වන ලෙසද අමාත්‍යවරයා එමගින් ඉල්ලා සිටියේය.

මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ කාර්ය සාධනය විමසීම සඳහා එම කොමිෂන් සභාවේ සභාපති ජනක රත්නායක මහතා ඇතුළු එහි ප්‍රධානීහු පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාව හමුවට පසුගිය 6 වැනිද කැඳවනු ලැබ සිටියහ. සභාපතිවරයා එම ආන්දෝලනාත්මක ප්‍රකාශය කර ඇත්තේ ඒ රැස්වීමේදීය.

# කුකුළු මස් - බිත්තර තව මාස 3 කින් විතර දකින්න නොලැබේවි

## කුකුළු කොටු බාගයක් වැහිලා

## බිත්තර නිපැයුම සියයට 50 කින් බැහැලා

■ මුදිතා දයානන්ද

### සංගම් සභාපති කියයි

**කුකුළු මස් හා බිත්තර තව මාස තුනක් පමණ වනවිට වෙළෙඳ පොළේ දැකිය නොහැකි ආහාර ද්‍රව්‍යයක් බවට පත්වීමේ අවදානමක් ඇතැයි සමස්ත ලංකා කුකුළු නිෂ්පාදකයන්ගේ සංගමයේ සභාපති අජිත් ගුණසේකර මහතා ලංකාදීපයට ඊයේ (30) පැවසීය.**

සත්ව ආහාර නිෂ්පාදනය අඩාලවීමත්, කුකුළන් සඳහා අවශ්‍ය ඖෂධ විටමින්, එන්නත් වර්ග ආදිය ආනයනය සීමාවීමත් නිසා පැටවුන් බෝ කිරීම ගොවීන් විසින් සීමා කර ඇති බවද ඒ නිසා දැනට සිටින කුකුළන් මස් කර අවසන් වූ පසුව නැවත මස් කිරීමට ගොවිපොළවල කුකුළන් නැතිවනු ඇති බවද ඔහු සඳහන් කළේය.

ආහාර හා අනෙකුත් ද්‍රව්‍යවල හිඟය නිසා දැනටමත් රටේ සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළ අඩකටත් වඩා වැඩි ප්‍රමාණයක් වැසී ගොස් ඇතැයි ද ඔහු පැවසීය.

එසේම බිත්තරයක් සඳහා දරන්නට වන වියදම බිත්තරයකින් ලැබෙන ආදයමට වඩා වැඩි බවද එය ඉදිරියේදී තවත් ඉහළ යනු ඇති බවද ගුණසේකර මහතා කීවේය.

ඒ නිසා බිත්තර සඳහා කිකිළි පැටවුන් ඇති කිරීම හා බෝ කිරීම මේ වනවිට සීමා කර ඇති බවද එය ඉදිරියේදී සම්පූර්ණයෙන්ම නැවතීමේ ඉඩකඩ වැඩි බවද ඔහු පැවසීය.

දැනට පැටවුන් බෝ කිරීමට සිටින මවු කිකිළියන් නඩත්තු කිරීම අපහසු නිසා ඔවුන් මසට විකිණීමට ගොවීන් පෙළඹී ඇති බවද ඒ නිසා බිත්තර නිෂ්පාදනය සියයට පනහකටත් වඩා වැඩි ප්‍රමාණයකින් කඩා වැටී ඇති බවද ඔහු පැවසීය.

බිත්තරයක හෝ මස් කිලෝවක හෝ මිල ඉහළ දැමිය හැකි උපරිම සීමාවක් ඇති බවද ජනතාවගේ ආදයම් මාර්ග වැඩි නොවන තත්ත්වයක් යටතේ එසේ බිත්තර හා මස් මිල ඉහළ දැමීමෙන් ජනතාව ඒවා මිලදී ගැනීමෙන් ඈත් වන බවද ඔහු සඳහන් කළේය.

# නාමල්ගේ බිරිය පුතා ප්‍රංශයට

■ කටුනායක ටී.කේ.ජී. කපිල

**හිටපු ඇමැති නාමල් රාජපක්ෂ මහතාගේ බිරිය ලිමිණි රාජපක්ෂ මහත්මිය සහ ඇයගේ දරුවා ඊයේ (08) අලුයම සිංගප්පූරුව ඔස්සේ ප්‍රංශය බලා පිටත්ව ගොස් ඇත.**

ඇය ඇගේ දරුවා සහ තවත් කිහිපදෙනකු ඊයේ අලුයම12.05ට කටුනායක ගුවන් තොටුපොළෙන් සිංගප්පූරු ගුවන් සේවයේ එස්. කිව්. -469 දරන ගුවන් යානයෙන් පළමුව සිංගප්පූරුව බලා පිටත්ව ගොස් ඇත.

ඇය සහ දරුවා කටුනායක ගුවන් තොටුපොළට ඇරලවීම සඳහා නාමල් රාජපක්ෂ මහතා ද ගුවන් තොටුපොළට පැමිණ සිටියේය.

# 1 ශ්‍රේණියට ගැනීම: අයැදුම්පත් කැඳවීම අගෝ: 1 ට දික් කරයි

■ ඩයනා උදයංගනී

**ලබන 2023 වර්ෂයේදී පාසල් වල පළමුවන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම සඳහා අයදුම්පත් කැඳවීමේ දිනය අගෝස්තු 1 වැනිදා දක්වා දීර්ඝ කර තිබේ.**

රටෙහි පවතින ගැටලුකාරී තත්වය හේතුවෙන් 2023 වසරේ පළමු ශ්‍රේණියට සිසුන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසාන දිනය දීර්ඝ කර දෙන මෙන් දෙමාපියන්ගෙන් ලැබෙන ඉල්ලීම් සළකා මෙම පියවර ගත් බව අධ්‍යාපන අමාත්‍යාංශය පවසයි. මෙම දිනය ලබන 16 වැනිදයින් අවසන්වීමට නියමිතව තිබිණි.

# ගමන් බිමන් සීමා කරනු: මැති ඇමැතින්ට ආරක්ෂක අංශ කියති

■ සුජිත් හේවාජුලිගේ

**කොළඹ නගරයේදී ආණ්ඩුවට එරෙහිව පැවැත්වෙන විරෝධතාව හේතුවෙන් ආරක්ෂක පියවරක් ලෙස සිය ගමන් බිමන් අද (9) දිනයේ හැකිතාක් සීමා කරන ලෙස ආරක්ෂක අංශ ප්‍රධානීන් සියලුම මැති ඇමැතිවරුන්ට දැනුම් දී ඇත.**

විශේෂයෙන්ම කොළඹ නගරයේ ගමන් කිරීම දැඩි ලෙස සීමා කරන ලෙසද විරෝධතාකරුවන් පැමිණෙන මාර්ග සම්පූර්ණයෙන්ම මගහැර ගමන් කරන ලෙසද දන්වා තිබේ.

සියලුම මැති ඇමැතිවරුන්ගේ නිවාසවලටද ඔවුන්ගේ වෙනත් දේපළවලටද අද දිනයේ වැඩි ආරක්ෂාවක් ලබාදීමට පියවර ගෙන ඇතැයි ආරක්ෂක අංශ ප්‍රකාශකයෙක් 'ලංකාදීප'යට පැවැසීය.

ප්‍රචණ්ඩකාරී පිරිසක් විසින් පසුගිය මැයි මස 9 වැනිද කරන ලද ප්‍රහාරවලින් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී අමරකීර්ති අතුකෝරළ මහතා ජීවිතක්ෂයට පත්විය.

මැති ඇමැතිවරුන් හැත්තෑ දෙදෙනකුගේ නිවාසද ගිනි තබා විනාශ කරනු ලැබීය.

එම සිද්ධිවලින් පසුව සියලුම මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව දෙගුණයකින් වැඩි කිරීමට පියවර ගැනිණි.

ඒ අනුව සෑම මන්ත්‍රීවරයකුගේම ආරක්ෂාව සඳහා පොලිස් නිලධාරීහු 6 දෙනෙක් පොලිස් මූලස්ථානය විසින් අනුයුක්ත කරනු ලැබූහ.

# ගෝඨා දිගටම සිටියොත් අර්බුදය දිග් ගැහේවි

## ජනතා පිළිගැනීමක් නෑ: රටේ විශාල වෙනසක් ඕනෑ

■ සුජිත් හේවාජුලිගේ

### මන්ත්‍රී නාලක ගොඩහේවා කියයි

**ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ධුරයේ දිගටම රැඳී සිටීමෙන් රටේ අර්බුදය විසඳිය නොහැකි බව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය නාලක ගොඩහේවා මහතා පැවැසීය.**

මේ අවස්ථාවේදී ජනාධිපතිවරයාට ජනතාවගේ පිළිගැනීමක් නැති බවද ඔහු සඳහන් කළේය.

පාර්ලිමේන්තුවේ කොපමණ බහුතරයක් සිටින්නේද යන වග තවමත් හරි හැටි අධ්‍යනයක් කර නොමැති බවත්, මෙවැනි විශාල අර්බුදයක් ඇතිවුණ මොහොතක ජනතාවට අලුත් බලාපොරොත්තුවක් දිය යුතු බවත් ගොඩහේවා මහතා පැවසුවේය.

ආණ්ඩුව කරන දේ විශ්වාස නොකරන තුරු ජනතාවගෙන් ආණ්ඩුවට කිසිදු සහායක් නොලැබෙන බව පැවසූ මන්ත්‍රීවරයා ජනතාවගේ විශ්වාසය දිනාගත හැකි විශාල වෙනසක් රටේ සිදු විය යුතු බවද පෙන්වා දුන්නේය.

ඒ විශාල වෙනසේදී ජනාධිපතිවරයා වැදගත් සාධකයක් බවත් එම සාධකය එතන තියෙන තුරු විශ්වාසය ගොඩනැගිය නොහැකි බවත් ඔහු කීවේය.

ජනාධිපතිවරයා තවදුරටත් ධුරයේ රැඳී සිටීමෙන් ජනතා විශ්වාසය ගොඩනැගිය නොහැකි බව තමා විශ්වාස කරන්නේ යැයි නාලක ගොඩහේවා මහතා පැවැසීය.

ආචාර්ය නාලක ගොඩහේවා මහතා ජනපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති මාලාව සකස් කළ කණ්ඩායමේද සාමාජිකයෙකි.

## ණයබර වැඩි කිසිරටකට ණය දෙන්නේ නෑ

# ණය ප්‍රතිව්‍යුහගත කිරීම: චීනයට හෝ වෙනත් රටකට විශේෂයක් එපා

### ඇමෙරිකානු තානාපතිනිය

■ විමුක්ති එස්. රුදිගු

**ශ්‍රී ලංකාව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී චීනයට හෝ වෙනත් කිසිම රටකට විශේෂ සැලකිල්ලක් නොදැක්විය යුතු බවත් ශ්‍රී ලංකාවට ණය ලබා දුන් සියලු පාර්ශ්වවලට එක හා සමාන ලෙස සැලකිය යුතු බවත් ශ්‍රී ලංකාවේ ඇමෙරිකානු තානාපති ජූලී චන්ග් මහත්මිය ප්‍රකාශ කළාය.**

පුළුල් ණය ප්‍රතිව්‍යුහගත කිරීමක් අවශ්‍ය සහ ණය බරින් පීඩිත වූ රටකට ලෝකයේ කිසිම රටක් හෝ ජාත්‍යන්තර බැංකුවක් ණය ලබා නොදෙන බවද ඇය සඳහන් කළාය.

ශ්‍රී ලංකාවේ ඇති වී තිබෙන වත්මන් ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට තිබෙන එකම විසඳුම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය ලබා ගැනීම පමණක් බව ඇමෙරිකානු තානාපති ජූලී චන්ග් මහත්මිය පැවසුවාය. එය ඇමෙරිකා එක්සත් ජනපදය, ජාත්‍යන්තර ප්‍රජාව පමණක් නොව ශ්‍රී ලාංකික ජනතාව පවා විශ්වාස කරන දෙයක් බවද ඇය සඳහන් කළාය.

ඇමෙරිකා එක්සත් ජනපදය සහ ජාත්‍යන්තර ප්‍රජාව ශ්‍රී ලංකාවට සහාය වීමට නව ආණ්ඩුවක් පත් වනතුරු බලා සිටින බව කීම ජනතාව අතර තිබෙන වැරදි වැටහීමක් බවත් ඇමෙරිකාවේ මිත්‍රත්වය, සහාය ජනාධිපති ධුරයේ හෝ අග්‍රාමාත්‍ය ධුරයේ සිටින්නේ කවුදැයි යන්න මත පදනම් නොවන බවත් ජූලී චන්ග් මහත්මිය ප්‍රකාශ කළාය.

ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය ලබා ගත යුතු යැයි අමෙරිකාව, ජපානය සහ ඉන්දියාව පමණක් නොව ජාත්‍යන්තර ප්‍රජාව ආර්ථික විද්‍යාඥයන් ද ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික අර්බුදය ආරම්භයේදී නිර්දේශ කළ බවත් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය ලබා ගැනීමට ප්‍රමාද වූ බවත් ජූලී චන්ග් මහත්මිය කීවාය.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සහ එහි විනිවිදභාවය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නිර්දේශ කළ පමණින් කළ යුතු දෙයක් නොවන බවත් ඉන් ශ්‍රී ලංකාවටද යහපතක් සිදුවන බවත් ඇය සඳහන් කළාය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය ලබා දීම සඳහා ඔවුන් නිර්දේශ කරන ප්‍රතිපත්ති සහ තීරණ ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාවට ඉතාමත් අපහසු වනු ඇතැයි කී ජූලී චන්ග් මහත්මිය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකාවට පමණක් නොව ලෝකයේ ඕනෑම රටකට අපහසු කටයුත්තක් බවද සඳහන් කළාය.

නමුත් ශ්‍රී ලංකාව එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී දැඩි අවදානමකට ලක්වූ ජනතාව මෙන්ම දුප්පත් ජනතාව ආරක්ෂා කර ගැනීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මෙන්ම ආමෙරිකානු එක්සත් ජනපදය ද්විපාර්ශවික හවුල් කරුවන් ලෙස වගබලා ගත යුතු බවද ජූලී චන්ග් මහත්මිය පැවසුවාය.

ශ්‍රී ලංකාවට මානුෂීය සහාය වැදගත් වන්නේ එම නිසා බවද ඇය සඳහන් කළාය.

ඇමෙරිකා එක්සත් ජනපදය සහ පැරිස් ක්ලබ් හවුල්කරුවන් ශ්‍රී ලංකාවේ ආර්ථිකය නැවත යථාතත්වයට පත් කිරීමට සහාය දක්වන බව කී ඇය නමුත් බටහිර රටවල්, ජපානය සහ ඉන්දියාව පමණක් නොව චීනයද මේ වෙලාවේ ශ්‍රී ලංකාවට සහාය දැක්වීමට ඉදිරියට පැමිණිය යුතු බව පැවසුවාය.

ශ්‍රී ලංකාවට ලබා දිය හැක්කේ කුමන ආකාරයක සහායක් දැයි ජාත්‍යන්තර ප්‍රජාව තීරණය කර එය ලබා දිය යුතු බවද ජූලී චන්ග් මහත්මිය ප්‍රකාශ කළාය.

ශ්‍රී ලංකාවට ණය ලබා දී ඇති පාර්ශ්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා සහාය ලබා දිය යුතු බවද ඇය සඳහන් කළාය.

# තෙල් දීම අත්හිටුවයි: සඳුදා සිට යළි

■ යොහාන් භාසුර

**ලංකා ඉන්දියන් ඔයිල් සමාගම (එල්.අයි.ඕ.සී.) එම සමාගමේ ඉන්ධන පිරවුම්හල්වලට ඉන්ධන නිකුත් කිරීම ඊයේ (8) සිට දින තුනක් නතර කළ බව එහි කළමනාකාර අධ්‍යක්ෂ මනෝජ් ගුප්තා මහතා පවසයි.**

ඒ අනුව ඊයේ සිට හෙට (10) දිනයද ඇතුළත්ව දින තුනක් ඉන්ධන පිරවුම්හල්වලට ඉන්ධන නිකුත් නොකරන බවත් පිරවුම්හල්වලට ඉන්ධන බෙදාහැරීම ලබන සඳුද (11 වැනිද) සිට නැවත ආරම්භ කරන බවත් ඔහු සඳහන් කරයි.

එම කාලය තුළ සමාගමේ ත්‍රිකුණාමලය තෙල් පර්යන්තයෙන් ලංකා ඛනිජ තෙල් සංස්ථාවට සහ කර්මාන්ත සඳහා පමණක් අඛණ්ඩව ඉන්ධන නිකුත් කරන බව ද මනෝජ් ගුප්තා මහතා සඳහන් කරයි.


එම සමාගම ඉන්ධන සැපයුම අත්හිටුවීමට හේතුවක් ඉදිරිපත් නොකරන අතර එම සමාගම සතුව ඉන්ධන තොග ප්‍රමාණවත් පරිදි ඇති බව ද වාර්තා වේ.

ඉන්දියන් ඔයිල් සමාගමේ මෙම තීරණයත් සමඟ ඉන්ධන පෝලිම්වල දින ගණනක් රැඳී සිටින ජනතාව දැඩි අපහසුතාවකට පත්ව සිටින අතර ඔවුහු ඊයේ පස්වරුව වන විටත් ඉන්ධන පෝලිම්වල රැඳී සිටියහ.

අයි.ඕ.සී. සමාගමේ මෙම තීරණය පිළිබඳව දැනුවත්වීමෙන් පසුව පෝලිම්වල සිටින ජනතාව නොසන්සුන් වූ බව ද වාර්තා වේ.

### අනේද කියන්නෙ ! – තලන්

| | |
|---|---|
| පෝලිම්වලත් දරුවන් බිහි කරති | අද |
| ඉන්ධන පෝලිමක හරකෙක් තිබුණි | බැඳ |
| පෝලිම වනාහී ජනගත කරන | ලද |
| නව සංකල්පයකි ගෝඨාභයගෙ | හොඳ |



# පොඩි කාලේදීම මව පියා නැතිවුණා

# පුතා රුස්ස ගහක් වෙලා අපිට සෙවණ දෙයි කියා අපි බලා හිටියා

■ යක්කලමුල්ල ජේ.කේ.එල්. චාමින්ද සහ උඩුගම රවී ලියනගේ

**පුතා ගැන අපි ගොඩක් බලාපොරොත්තු තියාගෙන හිටියේ. පුතාට ඉහළට යන්න අපි ලොකු සහයෝගයක් ලබා දුන්නා. අපි හිතාගෙන හිටියේ පුතා විශාල වෘක්ෂයක් වෙලා අපිට සෙවණක් දේවි කියලා. නමුත් ඒ වෘක්ෂය මුලින්ම කපාදැම්මා වගේ දෙයක් වුණේ යැයි මාගාල්ල අයි.ඕ.සී. ඉන්ධන පිරවුම්හලේ පෝලිමේ දී ඇතිවූ ගැටුමේ දී මියගිය තරුණයාගේ පුංචි අම්මා වන අම්බිකා උපමාලි මහත්මිය කීවාය.**

කඩු, කිණිසි හා තියුණු ආයුධවලින් පහරදීමෙන් මෙසේ ඝාතනය කොට ඇත්තේ අක්මීමන, උඩුමුල්ලවත්ත, යටගල, වංචාවල ප්‍රදේශයේ පදිංචි ඩී.ඩබ්ලිව්. අචිර සාලින්ද (24) නමැති කොතලාවල ආරක්ෂක පීඨයේ උපාධිධාරියෙකි.

මාගාල්ල අයි.ඕ.සී. ඉන්ධන පිරවුම්හලේ පෝලිමේ තිබූ වැගන්ආර් කාර් රථයකට ඉදිරියෙන් තවත් කාර් රථයක් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් දෙපිරිසක් අතර ඇති වූ ගැටුමක් දුරදිග යාමෙන් අචිර සාලින්දට සිය ජීවිතයෙන් වන්දි ගෙවීමට සිදුවිය.

අම්බිකා උපමාලි මහත්මිය මෙසේද කීවාය.


මෙම දරුවා පොඩි කාලයේ ඉඳලා පෙර පාසල් ගියේ මගේ ළඟ ඉඳලා. ඉගෙනීමට දක්ෂයි. ශිෂ්‍යත්ව විභාගයද සමත්වුණා. ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයේ තමයි ඉගෙනුම ලැබුවේ. සාමාන්‍ය පෙළ විභාගයත් ඉහළින් සමත්වුණා. 2016 වර්ෂයේ දී උසස් පෙළ විභාගයට පෙනී ඉඳලා විෂයන් තුනට සම්මාන තුනක් ලබාගත්තා. පුතා කුලියාපිටිය විශ්වවිද්‍යාලයට තේරුණා. මුදල් ගෙවලා කොතලාවල ආරක්ෂක පීඨයට ඇතුළත් වෙලා ඉගෙනගත්තා. පුතා උපාධිය සමත්වෙලා තිබුණේ. උපාධි ප්‍රදානෝත්සවයට තමයි සහභාගි වෙන්න තිබුණේ. නමුත් පුතාගේ දෛවය ඒ සඳහා ඉඩ දුන්නේ නැහැ.

පුතාගේ තාත්තා රණවිරුවෙක්. ජයසිකුරු මෙහෙයුමේ දී 95 වර්ෂයේ දී ඔහු මියගියා. එතකොට පුතාගේ වයස අවුරුද්දයි මාස දෙකයි. පුතා සාමාන්‍ය පෙළ විභාගය සමත්වෙලා උසස් පෙළ විභාගය සඳහා සූදනම් වෙමින් සිටියදී තමයි මව 2015 වර්ෂයේ දී කළහේ බස්නැවතුමේ දී රිය අනතුරකට ලක්වෙලා මියගියේ.

අම්මා පාසල් ගුරුවරියක්. ගාල්ල විද්‍යාලෝක විද්‍යාලයේ තමයි ඒ වනවිට ඉගැන්වීම් කටයුතුවල නිරතවෙලා හිටියේ. මව මිය යනවිට පුතාගේ වයස අවුරුදු 17යි. පවුලේ ඉන්නේ මියගිය පුතා සහ ඔහුගේ සහෝදරයායි. මව මියගොස් වසරකට පසුව තමයි පුතා උසස් පෙළ විභාගයට පෙනී සිටියේ. අම්මා නැතිවුණාට පසු මම තමයි පුතාගේ වගකීම ගත්තේ. මගේ අයියලත් ගොඩක් උදව් කළා.

පුතා ඉගෙනීමට ගොඩක් දක්ෂයි. පුතා ගැන අපි ගොඩක් බලාපොරොත්තු තබාගෙන තමයි හිටියේ. පුතා කොළඹ නගරයේ පෞද්ගලික ආයතනයක රැකියාව කළා. ඊයේ (07) තමයි නිවාඩු ලැබිලා ගෙදර ආවේ. ගෙදර ටික වෙලාවක් ඉඳලා තමයි තෙල් පෝලිමට ගියේ. මේ වගේ දෙයක් වේවි කියලා සිහිනෙකින්වත් සිතුවේ නැහැ. අම්මයි තාත්තයි නැති දරුවෝ දෙන්න අධ්‍යාපනය ලබාදීලා උසස් මහත් කරලා මේ පුතා ගැන කෙතරම් බලාපොරොත්තු තබාගෙන ද හිටියේ. නමුත් සියලු බලාපොරොත්තු සුන්වුණා යැයි ඇය හැඬූ කඳුළින් යුතුව කීවාය.





පුංචි අම්මා අම්බිකා උපමාලි

බාප්පා කේ. සමන්ත

**මියගිය තරුණයාගේ බාප්පා වන කේ. සමන්ත මහතා මෙසේ කීවේය.**

මා රුමස්සල පදිංචිවෙලා ඉන්නේ. මියගොස් සිටින්නේ මගේ නංගීගේ පුතා. ඔහු කොළඹ නගරයේ පෞද්ගලික රෝහලක සේවය කරනවා. ඊයේ (07) තමයි නිවාඩු ලබාගෙන ගෙදර ආවේ. නිවසේ පැයක් පමණ ඉඳලා තියෙනවා. පුතාගේ යාළුවා ඉඳලා තියෙනවා තෙල් පොලිමේ. පුතා තෙල් පෝලිමට ගිහින් තියෙනවා. එතැනදී තමයි ගැටුමක් ඇතිවෙලා පුතාට පහරදීලා තියෙන්නේ. බලහත්කාරයෙන් කාර් රථයක් තෙල් පෝලිමට ඇතුළු කිරීම නිසා කතා බහක් ඇතිවෙලා තියෙනවා. ඊට පස්සේ තමයි මෙම ගැටුම ඇතිවෙලා තියෙන්නේ.

එම කාර්රථයේ පුද්ගලයාගේ හිතවතුන් පිරිසක් කඩු කිණිසි අරගෙන ඇවිත් තමයි පුතාට පහරදීලා තියෙන්නේ. පුතාගේ අයියා මේ අයට කෑම අරගෙන ඇවිත් තියෙනවා. ඒ අවස්ථාවේ ඔහුටත් කඩුවකින් පහරදීලා ගෙල තුවාල වෙලා රෝහලේ ප්‍රතිකාර ලබනවා. පුතාගේ තව මිතුරෙකුගේ අත කැපිලා රෝහලේ ප්‍රතිකාර ලබනවා. විස්සක් පමණ පිරිසක් ඇවිත් පුතා තනිකරලා තමයි පහරදීලා තියෙන්නේ. මම එම ස්ථානයට යනවිට පුතා වැටිලා ඉන්න කොට ලොරියකින් තමයි රෝහලට අරගෙන ගිහින් තියෙන්නේ. රෝහලට රැගෙන යනවිටත් පුතා මියගිහින් තියෙනවා. නිවෙසකට යන්න තිබූ ස්ථානයකින් තමයි තෙල් පෝලිමට බලහත්කාරයෙන් කාර් රථය ඇතුළත් කරලා තියෙන්නේ. කඩුකිණිසිවලින් පහරදීලා තියෙනවා යැයි සමන්ත කීවේය.

## පුංචි අම්මා කියයි



ඝාතනයට ලක්වූ අචිර

## මාගාල්ල තෙල් පෝලිමේ ගැටුමෙන් තරුණයකු මියයාම

මෙම ඝාතනය තෙල් පෝලිමක සිදුවූ පළමු ඝාතනය වන අතර උගත් බුද්ධිමත් තරුණයකුට අකාලයේ සිය ජීවිතයෙන් වන්දිගෙවීමට සිදුවිය. මෙකී තරුණයාගේ ඝාතනයෙන් අක්මීමන, යටගල, වංචාවල ප්‍රදේශය ශෝකයෙන් ඇළලී ගොස් ඇත්තේය. අචිර සාලින්ද සුන්දර යොවුන් වියේ පසුවූ තරුණයෙකි. මියගිය තරුණයාගේ පශ්චාත් මරණ පරීක්ෂණය ගාල්ල, කරාපිටිය ශික්ෂණ රෝහලේ දී පැවැත්වීමට නියමිතව තිබුණි.

මෙම ඝාතනයට සම්බන්ධ ප්‍රධාන සැකකරු ඇතුළු තවත් සැකකරුවන් කිහිපදෙනකු කඩු, කිණිසි සමග අත්අඩංගුවට ගෙන ඇති බැව් ගාල්ල වරාය පොලීසිය පවසයි.

ගාල්ල වරාය පොලිසියේ ස්ථානාධිපති දුමින් කුමාර මහතා ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් විසින් සැකකරුවෝ අත්අඩංගුවට ගනු ලැබූහ.

## තුන්මංසල

| | |
|---|---|
| ගන්නට නොහැකි වී තෙල් ටික බෙහෙත් | ටික |
| නිම නැත රටේ ජනජීවිත විඳින | දුක |
| විසැඳුම් නොදී ඒ ගැන නිසි විලස | දැක |
| පාලකයන් කරන්නේ කල් මරන | එක |

තිලක

# ගාලු කොටු පවුරේ මහා දෝනාවක් හැරිලා

■ උණවටුන ඩී.ජී. සුගතපාල



**ඓතිහාසික ගාලු කොටු පවුරේ ඇවිදින මං තීරුවේ කොටසක් ගිලා බැසීමට ලක්ව තිබේ. ශ්‍රී සුධර්මාලය විහාරස්ථානය ඉදිරිපිට කොඩිගල අට්ටාලය අසල කොටු බැම්මේ කොටසක් මෙසේ ගිලාබැසීමට ලක්ව ඇති අතර සිද්ධිය වාර්තාවීමත් සමග එම ස්ථානයට ජනතාව පැමිණීම වැළැක්වීමට ගාලු උරුමය පදනම පියවර ගෙන ඇත.**

මේ සම්බන්ධයෙන් ගාලු උරුමය පදනමේ නිලධාරියකුගෙන් විමසූ විට ඔහු කියා සිටියේ මෙම ස්ථානය අපජලය බැසයාමේ පල්දෝරු පද්ධති ඇති ස්ථානයක් බවය. මෙම ස්ථානයට අමතරව ප්‍රදීපාගාරය අසල සහ හමුද කඳවුර අසල එවැනි ස්ථාන දෙකක් හඳුනාගෙන ඇති බවත් එම ස්ථානවලට ගමන් කිරීමෙන් වළකින ලෙස මහජනතාව දැනුම්වත් කර ඇති බවත් එම නිලධාරියා පැවසීය.

මෙම ස්ථානයේ අඩි විස්සකට වඩා ගැඹුරු දෝනාවක් හැරී තිබෙන අතර මහජනයා එම ස්ථානයට යෑම වළක්වාලමින් දැන්වීම් පුවරුද සවිකර ඇත.


සුපර් බෝල්
දිනුම් වාරය 1784 | වර්ණය කොළ
දිනය 2022.07.07 | දවස බ්‍රහස්පතින්දා
ජයග්‍රාහී අක්ෂරය සහ අංක
P 11 18 22 59
මීළඟ සුපිරි ජයමල්ල
රු. 66,402,647.60
දිනා ඇති මුළු මුදල
රු. 1,923,340/-
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
www.dlb.lk

අද කෝටිපති
බ්‍රහස්පතින්දා
දිනය : 2022.07.07
දිනුම් වාරය : 1610
වර්ණය : තද නිල්
මීළඟ සුපිරි ජයමල්ල
රු. 54,426,914/-
දිනා ඇති මුළු මුදල
රු. 2,994,740/-
ජයග්‍රාහී අංක
04 18 29 51
ඉංග්‍රීසි අක්ෂරය
P
ජයග්‍රාහී ටිකට් පත් මාස 6 ක් පමණක් වලංගු වේ.

ශනිදා
බ්‍රහස්පතින්දා
දිනුම් වාරය : 3945
දිනය : 2022.07.07
වර්ණය : රතු
ජයග්‍රාහී අංක
02 60 63 66
ඉංග්‍රීසි අක්ෂරය
N
දිනා ඇති මුළු මුදල
රු. 3,411,160/-
මීළඟ සුපිරි ජයමල්ල
රු. 69,160,466.40
ජයග්‍රාහී ටිකට් පත් මාස 6 ක් පමණක් වලංගු වේ.

12 කප්රුක
ඉංග්‍රීසි අක්ෂරය, සුපිරි අංකය සහ ජයග්‍රාහී අංක
W 14 04 11 12 41
දිනුම් වාරය : 960
වර්ණය : තැඹිලි
දිනය : 2022.07.07 බ්‍රහස්පතින්දා
දිනා ඇති මුළු මුදල
රු. 2,345,380/-
මීළඟ සුපිරි ජයමල්ල
රු. 246,983,923/-

ලග්න වාසනාව
දිනය : 2022.07.07
දිනුම් වාරය : 3496
වර්ණය : දම්රු
දිනා ඇති මුළු මුදල
රු. 6,336,920/-
දිනුම් අංක
08 29 32 53
කටක
මීළඟ සුපිරි ජයමල්ල
රු. 2,740,980/-

සංවර්ධන වාසනාව
දිනය : 2022-07-07
දිනුම් වාරය : 507
වර්ණය : නිල්
ඉංග්‍රීසි අක්ෂරය N
ජයග්‍රාහී අංක 56 57 67
දෛව අංකය 02
මීළඟ සුපිරි ජයමල්ල
රු. 11,195,044/-
දිනා ඇති මුළු මුදල
රු. 1,340,600/-
ජයග්‍රාහී ටිකට්පත් මාස 6 ක් වලංගුවේ.


# අද දවස ඔබට

## රාහු කාලය 09.01-10.31

### • මේෂ — අධ්‍යාපන දියුණුව

රැකියාවට සම්බන්ධ ගමන් බිමන් බහුල වේ. අධ්‍යාපන කටයුතුවල විශේෂ දියුණුවක් පෙන්වයි. මිතුරු වෙසින් එන සතුරන්ගෙන් පරිස්සම් වියයුතු දිනයකි. මානසික වශයෙන් ව්‍යාකූල සිතින් දවස ගෙවේ.

### • වෘෂභ — ලැබීම් යහපත්

මුදල් ගනුදෙනුවල දී හා පරිහරණයේ දී ඉතා කල්පනාකාරී විය යුතු දිනයකි. ලැබීම් අතින් යහපත් වුවත් වියදම් ඉහළ යයි. ඇසුරු කරන්නන් සඳහා වියදම් ඉහළයාමට හේතු යෙදේ. තම අඩුපාඩු රැසක් සපුරා ගැනීමට හැකිවේ.

### • මිථුන — අධික වැයවීම්

රැකියා පුහුණු කටයුතුවල යෙදෙන්නන්ට කාර්ය බහුල වේ. දේශපාලන කටයුතුවල නිරතවූවන්ට මහජන අප්‍රසාදය හිමිවේ. හදිසි තීරණවලට එළැඹීමට සිදුවේ. වියදම් අධික වන දිනයකි.

### • කටක — වැඩකටයුතු ප්‍රමාදයි

සමිති සමාගම් ආදිය සඳහා ඇරියුම් ලැබේ. යොදගත් වැඩ කටයුතු රැසක ප්‍රමාදවීම් සිදුවනු ඇත. කුලී රියැදුරන්ට සුබඵල සහිත දිනයකි. ලැබිය යුතු මුදලක් ප්‍රමාදවීමෙන් ගැටලු තත්ත්වයක් මතුවේ.

### • සිංහ — අධික ගමන් බිමන්

නොසන්සුන් සිතින් යුතුව දවස ගෙවීමට සිදුවේ. ගමන් බිමන් අධික වෙයි. වියදම් ඉහළ යාමට හේතු යෙදේ. නිතර මතුවන අසනීප තත්ත්වයක් බලපාන දිනයකි. ආගම දහමට වැඩියෙන් යොමුවේ.

### • කන්‍යා — නිශ්ඵල වියදම්

රැකියා ප්‍රධානීන්ගේ අප්‍රසාදයට හේතු මතුවේ. තම දරුවන්ගේ කටයුතු සඳහා වියදම් ඉහළ යයි. වියදම් කරන මුදලෙන් නිසිඵල ලැබීම අසීරුවනු ඇත. සිතේ සතුටට බාධක මතුවේ.

### • තුලා — අන්සතු දේපොළක්

ඇසුරු කරන්නන්ට වියදම් ඉහළ යාමට හේතු යෙදේ. අන්සතු දේපළකට හිමිකම් ලැබීමට ඉඩ ඇත. තම සේවකයකු හා විශ්වාසය පළුදුවීමට හේතු යෙදේ. තම වාහනයෙන් යන එන ගමන් බහුලවනු ඇත.

### • වෘශ්චික — නිවාස ලාබ

බලාපොරොත්තු නිවාස ලාබයක් හිමිවෙයි. තැන්පත් ධනය වැයවේ. ගමන් බිමන්වලදී වාහන පහසුකම් සැලසේ. තමාගේ අදහස්වලට අන්‍යයන් අවනත කර ගැනීමට හැකිවේ. සංගීතය වැනි කලා කටයුතු සඳහා යොමුවේ.

### • ධනු — අවිවේකී දවසක්

පොත් පත් හා ලිපි ලේඛන කටයුතුවල නිරතවූවන්ට කාර්ය බහුල වේ. දුෂ්කර කටයුතු සඳහා හිතවතුන්ගේ උපකාර ලැබේ. නිවසේ අවශ්‍යතාවක් සපුරා ගැනීමට හැකිවේ. සන්ධ්‍යා කාලයේ කෙටි ගමන් බිමන් යෙදේ.

### • මකර — නව ආදායම් මාර්ග

පවතින අසනීප තත්ත්වයකට ප්‍රතිකාර ගැනීමට සිදුවේ. නිවාස හා දේපළ සම්බන්ධ කටයුතු තුළින් වැඩි ලාබ හිමිවේ. බලාපොරොත්තු නව ආදයම් මාර්ගයක් සැලසේ. උත්සාහයේ තරමට ඵල ලැබිය හැකි දිනයකි.

### • කුම්භ — රැකියා ලාබ

. ක්ෂණික තීරණ මත බලවත් පාඩු සිදුවීමට ඉඩ ඇත. නිවාස හා දේපළක් සඳහා වියදම් ඉහළ යයි. දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා වැඩි උනන්දුවක් දක්වයි. අහම්බෙන් මෙන් නිදහස් රැකියා ලාබයක් හිමිවේ.

### • මීන — දුර ගමනක්

වාද විවාද ආදියට සම්බන්ධවීමෙන් හිතවතුන් හා මතභේද ඇතිවේ. ක්‍රීඩා කටයුතුවලට සම්බන්ධවූවන්ට කාර්ය බහුල වේ. වෛද්‍ය සේවයේ නිරතවූවන්ට කාර්ය බහුල වේ. තම හිතවතකුගේ ඇරයුමක් මත දුර ගමනක් යෙදේ.

ගම්පහ . අබේසේන හේරත්

# මාවනැල්ලේ වැඩිමිලට ඩීසල් වික්ක 2 ක් මාට්ටු

■ මාවනැල්ල විශේෂ පී. ශාන්ත බණ්ඩාර සහ මාවනැල්ල බණ්ඩාර ජයරත්න

**මාවනැල්ල, වල්පොලදෙණිය ප්‍රදේශයේදී වෑන් රථයකින් පැමිණ ත්‍රිරෝද රථයකට වැඩි මිලට ඩීසල් අලෙවි කරමින් සිටියදී ඩීසල් ලීටර් 36 සමග සැකකරුවන් දෙදෙනකු පොලිසිය පෙරේදා (07 දා) දහවල් අත්අඩංගුවට ගත් බව මාවනැල්ල පොලිසිය පැවසීය.**

මාවනැල්ල පොලීසියේ විශේෂ කාර්යංශයට ලද තොරතුරක් මත වෑන් රථයෙන් ඩීසල් විකුණමින් සිටි බව කියන මාවනැල්ල ප්‍රදේශයේම පදිංචි 55, 50 යන වයස් කාණ්ඩවල පුද්ගලයන් දෙදෙනකු, ඩීසල් ලීටර් 18 බැගින් අඩංගු කෑන් දෙකක්, ඩීසල් ඇදීම සඳහා යොදගත් බටයක් ද අත්අඩංගුවට ගත් බවද පොලිසිය පැවසීය.

අත්අඩංගුවට ගත් සැකකරුවන් දෙදෙනා සහ නඩුභාණ්ඩ අධිකරණය හමුවට ඉදිරිපත් කිරීමට නියමිතව ඇති බවද පොලිසිය පැවසීය.

මාවනැල්ල පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ලසන්ත කලුආරච්චි මහතාගේ උපදෙස් මත දූෂණ වැටලීම් ඒකකයේ ස්ථානාධිපති උපපොලිස් පරීක්ෂක ප්‍රසන්න ආරගොඩ, පොලිස් සැරයන් 49355 චානක, පොලිස් කොස්තාපල් 97457 දුෂ්මන්ත යන මහත්වරු වැටලීම සිදුකළහ.

ලංකාදීප
2022 ජූලි මස 9 වැනිදා සෙනසුරාදා

# ක්‍රීඩා SPORTS

# ලැබුෂේන් ස්මිත් ඕස්ට්‍රේලියාව ඔසවති


ස්ටීවන් ස්මිත් (ඡායාරූපය: ගයාන් අමරසේකර

### ලකුණු පුවරුව

**ඕස්ට්‍රේලියාව - පළමු ඉනිම**

| | |
|---|---|
| උස්මන් කවාජා - ප.රමේෂ් මෙන්ඩිස් | 37 |
| ඩේවිඩ් වෝනර් - ප.කසුන් රාජිත | 5 |
| මානස් ලැබුෂේන් - ස්ට.දික්වැල්ල ප.ජයසූරිය | 104 |
| ස්ටීවන් ස්මිත් - නොදැවී | 109 |
| ට්‍රැවිස් හෙඩ් - ප.ජයසූරිය | 12 |
| කැමරන් ග්‍රීන් - ක.මු.කළා ප.ජයසූරිය | 4 |
| ඇලෙක්ස් කේරි - නොදැවී | 16 |
| අතිරේක | 11 |
| එකතුව - (ඕවර 90) කඩුලු 5 ක් දැවී | 298 |

**කඩුලු වැටීම :** 1-15(ඩේවිඩ් වෝනර්), 2-70(උස්මන් කවාජා), 3-204(මානස් ලැබුෂේන්), 4-238(ට්‍රැවිස් හෙඩ්), 5-252(කැමරන් ග්‍රීන්)

**පන්දුවට පහර දීමට සිටින පිතිකරුවෝ:** මිචෙල් ස්ටාක්, පැට් කමින්ස්, නේතන් ලයන්, මිචෙල් ස්වෙප්සන්

**පන්දු යැවීම :** කසුන් රාජිත 19-4-56-1, රමේෂ් මෙන්ඩිස් 28-1-100-1, මහීෂ් තීක්ෂණ 15-2-45-0, ප්‍රභාත් ජයසූරිය 28-2-90-3

■ දමින්ද විජේසූරිය ගාල්ල ක්‍රීඩාංගණයේ සිට.

**සිය මංගල ටෙස්ට් තරගයට සහභාගි වන ප්‍රභාත් ජයසූරිය (90/3), වෙහෙසකර පන්දු යැවීමක නිරත වෙමින්, එක දිගට ඕවර 16 ක් යවා කඩුලු 3 ක් දවාගත්තේය. එහෙත් අලංකාර ශතක දෙකක් ලබාගත් මානස් ලැබුෂේන් (104) සහ ස්ටීවන් ස්මිත් (නොදැවී 109) දෙදෙනා ගාල්ලේදී පැවැත්වෙන දෙවැනි ටෙස්ට් තරගයේ පළමු දිනය අවසන් වන විට ගෞරවනීය ස්ථානයක් කරා ඕස්ට්‍රේලියාව ඔසවා තැබූහ.**

වෝන් - මුරලි කුසලාන තරගාවලියේ දෙවැනි තරගය වන මෙම තරගයේ පළමු දිනයේ ක්‍රීඩාව ඊයේ (08 වැනිදා) සවස නතර කරන විට ඕස්ට්‍රේලියානුවෝ කඩුලු 5 ක් දැවී ලකුණු 298 ක් ලබා සිටියහ. මෙම ලකුණු සංඛ්‍යාවෙන් 71.47 % ක ප්‍රමාණයක් ස්මිත් සහ ලැබුෂේන් ලබාගත් ඒවාය.

ලැබුෂේන් සමගින් එක්ව තුන්වැනි කඩුල්ල වෙනුවෙන් ලකුණු 134 ක සම්බන්ධතාවක් ගොඩනැංවූ ස්මිත්, විනාඩි 269 ක් පුරා සිය කඩුල්ල ආරක්ෂා කරගනිමින් පන්දු 212 කට මුහුණ දී ඒවායින් 14 ක් හතරේ සීමාවෙන් එපිටට යැවීය.

වසර 2004 දී පැවැති ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලියාව අතර පැවැති ටෙස්ට් තරගාවලියෙන් පසුව කිසිම ඕස්ට්‍රේලියානු පිතිකරුවකු ගාල්ල ක්‍රීඩාංගණයේදී ශතකයක් ලබාගෙන නොතිබිණ. මුත්තයියා මුරලිදරන් මෙන්ම ෂේන් වෝන් ද ක්‍රීඩා කළ 2004 ටෙස්ට් තරගයේදී මැතිව් හේඩ්න් (130), ඩේමියන් මාටින් (110) සහ ඩැරන් ලීමන් (129) තිදෙනාම ශතක ලබාගත්හ. මුරලිදරන් සහ වෝන් දෙදෙනාම කඩුලු 10 ක් බැගින් ලබාගත්හ.

ප්‍රභාත් ජයසූරිය සහ රමේෂ් මෙන්ඩිස් දෙදෙනා ඊයේ දිනයේ බිඳවැටුණු කඩුලු 5 න් 4 ක හිමිකරුවන් වූ නමුත්, ඕස්ට්‍රේලියානුවෝ ඔවුන් දෙදෙනාගෙන් ලකුණු 190 ක් උදුරාගත්හ.

ප්‍රභාත්ගේ පන්දුවක් හමුවේ තම සීමාවෙන් ඉදිරියට පැමිණි ලැබුෂේන්, පන්දුවේ තිබූ දඟකැවීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම පරාජය වූයේය. සැණෙකින් පන්දුව අල්ලා ගත් නිරෝෂන් දික්වැල්ල කඩුල්ල බිඳ දැමුවේ, පිතිකරුවා ලකුණු 28 ක් ලබා සිටියදී තමාගෙන් සිදුවූ අතපසුවීමට සැනසිල්ලක් ගෙනෙමිනි.

ලකුණු 79 දී තුන්වැනි කඩුල්ල බිම දමාගත හැකිව තිබුණද නිරෝෂන් දික්වැල්ල වෙතින් ඉතාම පහසු ස්ටම්ප් කිරීමේ අවස්ථාවක් ගිලිහී ගියේය. ඒ වන විට ලැබුෂේන් ලබා සිටියේ ලකුණු 28 ක් පමණි.

ඕස්ට්‍රේලියානු ඉනිම ආරම්භයේ සිට දිවා ආහාරය දක්වාම එක දිගට පන්දු ඕවර 15 ක් යැවූ රමේෂ් මෙන්ඩිස් දිවා ආහාරයට පෙර ලකුණු 49 කට කඩුල්ලක් දවාගත්තේය. දික්වැල්ලට ස්ටම්ප් කිරීම සාර්ථක කරගත හැකිවූයේ නම් ලැබුෂේන්ගේ කඩුල්ලත් මෙන්ඩිස්ටම දවාගත හැකිව තිබුණ නමුත් දිවා ආහාරයෙන් පසුව ඕවර 13 ක් යැවූ මෙන්ඩිස්ට දෙවැනි කඩුල්ල දවාගත නොහැකි විය.

ලැබුෂේන්ගේ හත්වැනි ටෙස්ට් ශතකයත් සමගින් ඕස්ට්‍රේලියානුවෝ ලකුණු 200 කඩඉම පසුකළහ. ලකුණු 94 දී දිගු වේලාවක් රැඳී සිටි ලැබුෂේන් සිය ශතකය සඳහා පන්දු 147 කට මුහුණ දුන් අතර ඒවායින් 12 ක් හතරේ සීමාවෙන් එපිටට යවා තිබිණ.

දෙවැනි ටෙස්ට් තරගය සඳහා කදිම ආරම්භයක් ලබාගත් කසුන් රාජිත, තම තුන්වැනි ඕවරයේදීම ඩේවිඩ් වෝනර් දවාගත්තේය. පන්දු කිහිපයකින්ම වෝනර් අපහසුතාවට පත්කරමින් සිටි කසුන් රාජිත, තම තුන්වැනි ඕවරයේදී වෝනර්ගේ ඉනිම ලකුණු 05 කට සීමා කළේය. දෙවැනි කඩුල්ලේ සම්බන්ධතාව ලකුණු 55 ක් වන විට රමේෂ් මෙන්ඩිස් යැවූ ඉතාම හොඳ පන්දුවකින් උස්මන් කවාජා ලකුණු 37 කට දැවී ගියේය. පිට ඉන්න එල්ලයේ පතිත වූ පන්දුව, පිතිකරුවාගේ පිත්ත පරයමින් ගොස් පිට ඉන්නේ වදින විට කවාජා ලබා සිටියේ ලකුණු 37 කි.

කමිඳු මෙන්ඩිස්, ප්‍රභාත් ජයසූරිය සහ මහීෂ් තීක්ෂණ ඊයේ තම තමන්ගේ මංගල ටෙස්ට් හිස්වැස්ම ලැබූහ. දිනේෂ් චන්දිමාල්, දිමුත් කරුණාරත්න සහ නවීඩ් නවාස් මෙම ක්‍රීඩකයන්ට ටෙස්ට් හිස්වැසුම් පිරිනැමූහ.

# ආනන්ද-නාලන්දා සුලෝහිත සංග්‍රාමය හෙට-අනිද්දා

■ රොෂාන් ගුණරත්න

**ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම බෞද්ධ පිරිමි පාසල් ද්විත්වයක් වන කොළඹ ආනන්ද විද්‍යාලය සහ කොළඹ නාලන්ද විද්‍යාලය අතර 92 වැනි "සුලෝහිත සංග්‍රාමය" වාර්ෂික මහ ක්‍රිකට් තරගය හෙට - අනිද්ද (10-11) කොළඹ එස්. එස්. සී. ක්‍රීඩාංගණයේදී පැවැත්වේ.**

දිවංගත ආචාර්ය එන්. එම්. පෙරේරා අනුස්මරණ අභියෝග ශූරතා කුසලාන වෙනුවෙන් "සුලෝහිත සංග්‍රාමය" මහ ක්‍රිකට් තරගය වාර්ෂිකව පැවැත්වේ.

මෙවර සුලෝහිත සංග්‍රාමයේදී කොළඹ ආනන්ද විද්‍යාලයීය කණ්ඩායම වමත් පිතිකරු නෙත්ම කරුණාරත්න විසින් මෙහෙයවයි. නාලන්ද විද්‍යාලයීය කණ්ඩායමේ නායකයා ලෙස වේග පන්දු යවන ක්‍රීඩක දිනෙත් ෂෙහාන් සමරවීර කටයුතු කරයි.

ආනන්ද විද්‍යාලය සුලෝහිත සංග්‍රාම වාර්ෂික මහ ක්‍රිකට් තරග ඉතිහාසයේ ජයග්‍රහණ 12 ක් ලබාගනිමින් පෙරමුණේ පසුවේ. නාලන්ද විද්‍යාලයට ජයග්‍රහණ කිරීමට හැකිවී ඇත්තේ තරග 6 ක් පමණි. 2003 වසරේදී සුලෝහිත සංග්‍රාමය ජයග්‍රහණය කළ ආනන්ද විදුහල් කණ්ඩායම ආචාර්ය එන්. එම්. පෙරේරා අනුස්මරණ අභියෝග ශූරතා කුසලාන මේ දක්වා තමන් සන්තකයේ රඳවා තබාගැනීමට සමත් වී තිබේ.

රටේ වත්මන් තත්වය හමුවේ ආනන්ද - නාලන්ද ඒකාබද්ධ තරග සංවිධාන කමිටුව විසින් පාසල් ද්විත්වයේ ප්‍රධානීන්ගේ මඟපෙන්වීම යටතේ 92 වැනි "සුලෝහිත සංග්‍රාමය" මහ ක්‍රිකට් තරගය මෙවර ප්‍රේක්ෂක සහභාගිත්වයකින් තොරව පැවැත්වීමට තීරණය කර ඇත.

කෙසේ වුවත් මෙවර ආනන්ද - නාලන්ද "සුලෝහිත සංග්‍රාමය" මහ ක්‍රිකට් තරගය ඩයලොග් ටී.වී. නාලිකා අංක 140 ඔස්සේ සජීව විකාශය කිරීමට කටයුතු යොදා ඇත.

1996 ලෝක කුසලාන දිනූ කණ්ඩායමේ නායක අර්ජුණ රණතුංග, සිදත් වෙත්තමුණි, මාවන් අතපත්තු, චන්දික හතුරුසිංහ, තිලාන් සමරවීර, සචිත්‍ර සේනානායක, දිනේෂ් චන්දිමාල් ඇතුළු ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩකයන් රැසක් ආනන්ද විද්‍යාලයීය කණ්ඩායම නියෝජනය කර තිබේ. එමෙන්ම ශ්‍රී ලංකාවේ පළමු ටෙස්ට් නායක දිවංගත බන්දුල වර්ණපුර, අසංක ගුරුසිංහ, රොෂාන් මහනාම, කුමාර් ධර්මසේන, මහේල ජයවර්ධන ඇතුළු ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩකයන් රැසක් නාලාන්ද විද්‍යාලයෙන් බිහිවී ඇත. එවැනි තවත් විශිෂ්ටතම ක්‍රිකට් ක්‍රීඩකයන් රැසක් මෙරටට බිහි කළ අද්විතීය ක්‍රිකට් ඉතිහාසයක් මෙම පාසල් ද්විත්වය සතුවේ.

**ආනන්ද විද්‍යාලීය කණ්ඩායම**

නෙත්ම කරුණාරත්න (නායක), මිනෙත් ප්‍රේමරත්න, ලක්ෂිත කුලරත්න, නුෂල් ධර්මරත්න, හංසජ ජයසිංහ, ඉරුත් ගිම්ෂාන්, ශක්ති උදර, ටෙහාන් පෙරේරා, නෙත්ම සමරවීර, පුලිඳු කිරිඇල්ල, විලාෂ් කරුණාරත්න, අයේෂ් ශෂිමාල්, ඉසුරු අයේෂ්, යෙහාන් ගුණසිංහ, සචින් ජයසිංහ, විදුන විජේබණ්ඩාර, මලීෂ පෙරේරා, තිසුක සෙහස්.

**නාලන්ද විද්‍යාලයීය කණ්ඩායම**

දිනෙත් ෂෙහාන් සමරවීර (නායක), චනුල් අතුකෝරාල, රවීන් ද සිල්වා, විනුජ රන්පුල්, සජිත විතානගේ, එරංග ජයකොඩි, ලිසුර සිගේරා, රුසිරු විලෝචන, කුෂ්මිත සිල්වා, මිනෝද් කල්දේරා, යසිරු සමරකෝන්, ජනුල ඉඳුසර, රිසත් ජයරත්න, සදෙව් සමරසිංහ, නිකිල් අබේගුණසේකර, විනුක විජේසිංහ.

# සති අන්තයේ පාසල් රග්බි තරග කල් දමයි

■ ශානුක අරවින්ද

**ඩයලොග් පාසල් රග්බි ලීගය යටතේ මෙම සති අන්තයේදී පැවැත්වීමට නියමිතව තිබූ තරග දින නියමයකින් තොරව කල් දැමීමට ශ්‍රී ලංකා පාසල් රග්බි සංගමය පියවර ගෙන තිබේ. පෙරේදා (7 වැනිදා) අන්තර් ජාලය ඔස්සේ පැවැති පාසල් රග්බි සංගමයේ විධායක කමිටු රැස්වීමකදී ඔවුන් මෙම තීරණයට එළඹ ඇත.**

අද (9 වැනිදා) සහ හෙට (10 වැනිදා) යන දිනවලදී දිවයින පුරා පැවැත්වීමට නියමිත උද්ඝෝෂණ හේතුවෙන් ඔවුන් මෙම තීරණය ගෙන ඇතැයි වාර්තා වේ. කල් දමන ලද තරග බොහෝ දුරට තරගාවලියේ 6 වැනි සතියේදී පැවැත්වීමට නියමිත බවද එහිදී වැඩි දුරටත් වාර්තා වේ.

පළමු කොටසේ 'ඒ' කාණ්ඩයේ තරග 5 ක් සහ 'බී' කාණ්ඩයේ තරග 5 ක් මෙම සති අන්තයේදී පැවැත්වීමට නියමිතව තිබිණ. ඉන් තරග 7 ක් අද දිනයේදීද, තරග 3 ක් හෙට දිනයේදීද පැවැත්වීමට කටයුතු යොදා තිබිණ.


## ආසියානු කුසලාන තරගාවලිය - 2022
## ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ නිල අනුග්‍රාහකත්වය
අභිලාශය ප්‍රකාශ කිරීම (EOI)

Sri Lanka Cricket

2022 ආසියානු කුසලාන ක්‍රිකට් තරගාවලියට සහභාගී වන ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ නිල අනුග්‍රාහකත්වයන් වෙනුවෙන් ඉදිරිපත් වීමට කැමති දේශීය හා විදේශීය ආයතන වෙතින් අභිලාශය කැඳවීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය අපේක්ෂාවෙන් සිටී. තරගාවලිය 2022 අගෝස්තු මස 27 වන දා සිට සැප්තැම්බර් මස 11 වන දා දක්වා කාලයන් හී දී පැවැත්වීමට සැලසුම් කර තිබේ.

අතිශය දක්ෂ ලෝක මට්ටමේ ක්‍රීඩකයින් නියෝජනය කරන ශ්‍රී ලංකා ජාතික කණ්ඩායම තරග වදින මෙම තරගාවලිය තුල ඔබගේ වටිනා සන්නාමයට ජාත්‍යන්තර අවධානය දිනා ගැනීමට මෙයින් ඔබට අවස්ථාව උදාවේ. මෙම තරගය ජාත්‍යන්තර වශයෙන් විකාශය කරන අතර, ඩිජිටල් මාධ්‍ය ඔස්සේද විකාශය කිරීමට කටයුතු කරයි.

අදාල අනුග්‍රාහක කාණ්ඩ සඳහා තෝරාගත් හවුල්කරුවන්ට පහත සඳහන් පරිදි ක්‍රීඩා කරන ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ තම "සන්නාම ලාංඡනය" ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව හිමිවේ. තවද උනන්දුවක් දක්වන සමාගම්වලට පහත අනුග්‍රාහකත්ව කාණ්ඩ වලින් ඕනෑම එකක් හෝ සියල්ලේම එකතුවක් ලෙස ලබා ගත හැක.

| අනුග්‍රාහක කාණ්ඩ | වෙළඳ සළකුණ ස්ථාන ගත කිරීම | | වෙළඳ සළකුණෙහි ප්‍රමාණය |
|---|---|---|---|
| **ප්‍රධාන අනුග්‍රාහක** | මෙහි ඇති **ස්ථාන 4** සඳහාම භාවිතා කළ හැකි වන්නේ එක් **(1)** සන්නාම ලාංඡනයක් පමණයි | PLAYING SHIRT - MIDDLE CHEST<br>PLAYING SHIRT - LEADING ARM<br>PLAYING TROUSER - RIGHT HAND SIDE<br>CAP | වර්ග අඟල් 32 (වර්ග සෙන්ටි මීටර් 206.45)<br>වර්ග අඟල් 10 (වර්ග සෙන්ටි මීටර් 64.5)<br>වර්ග අඟල් 10 (වර්ග සෙන්ටි මීටර් 64.5)<br>වර්ග අඟල 6 (වර්ග සෙන්ටි මීටර් 38.71) |
| **ජර්සි පිටුපස අනුග්‍රාහකයා** | BACK OF THE JERSEY | | වර්ග අඟල් 32 (වර්ග සෙන්ටි මීටර් 206.45) |
| **කණ්ඩායම් අනුග්‍රාහක**<br>(අනුග්‍රාහක කාණ්ඩ සියල්ලෙහිම එකතුව) | මෙහි ඇති **ස්ථාන 5** සඳහාම භාවිතා කළ හැකි වන්නේ එක් **(1)** සන්නාම ලාංඡනයක් පමණයි | PLAYING SHIRT - MIDDLE CHEST<br>PLAYING SHIRT - LEADING ARM<br>BACK OF THE JERSEY<br>PLAYING TROUSER - RIGHT HAND SIDE<br>CAP | වර්ග අඟල් 32 (වර්ග සෙන්ටි මීටර් 206.45)<br>වර්ග අඟල් 10 (වර්ග සෙන්ටි මීටර් 64.5)<br>වර්ග අඟල් 32 (වර්ග සෙන්ටි මීටර් 206.45)<br>වර්ග අඟල් 10 (වර්ග සෙන්ටි මීටර් 64.5)<br>වර්ග අඟල් 6 (වර්ග සෙන්ටි මීටර් 38.71) |

**නිර්ණායක:**

අ. දුම්කොළ, මධ්‍යසාර ආශ්‍රිත නිෂ්පාදන අලෙවියෙහි නිරත (සෘජුව හෝ වක්‍රාකාරව) ඔට්ටු ඇල්ලීම්, අන්තර්ජාල ඔස්සේ සිදු කරන ඔට්ටු ඇල්ලීම් සහ සූදුව සම්බන්ධ ව්‍යාපාර වල අනුග්‍රාහකත්වයක් සඳහා අවසර නොදේ.

**මූල්‍ය යෝජනා ආකෘතිය හා ගෙවීම් සිදුකිරීමේ කොන්දේසි:**

A. අභිලාශය ප්‍රකාශ කරන දේශීය හෝ විදේශීය අයදුම්කරු මෙහි සඳහන් අයිතිවාසිකම් ලබා ගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙත ගෙවීමට යෝජිත ශුද්ධ හිමිකම් ගාස්තුව (සියලු බදු සහ වෙනත් අඩු කිරීම් රහිතව) සිය මූල්‍යමය යෝජනාවේ ඉලක්කමෙන් සහ අකුරින් දැක්විය යුතුය. (විදේශීය අයදුම්කරුවන් ඇමරිකානු ඩොලර් මගින් සහ දේශීය අයදුම්කරුවන් රුපියල් මගින් සිය මූල්‍ය යෝජනා ලබා දීමට හිමිකම් ලබයි)

B. පහත දැක්වෙන ගෙවීම් සිදුකිරීමේ ආකෘතිය ලබාදිය යුතු අයිතිවාසිකම් සම්බන්ධයෙන් පහත ආකාරයට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් නිල අනුග්‍රාහක වශයෙන් තෝරාගන්නා සාර්ථක අභිලාශය ප්‍රකාශ කරන්නා හිමිකම් ගාස්තු ගෙවීම සිදුකළ යුතුය:

A. සම්පූර්ණ හිමිකම් ගාස්තුව (උදා - ලබා දී තිබෙන වටිනාකම) **2022 ජූලි 20** වැනි දින හෝ ඊට පෙර සම්පූර්ණයෙන් ගෙවා නිම කළ යුතුය

B. ගෙවීම් සිදුකරන ආකාරය ඊ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙනුවෙන් නිකුත් කළ බැංකු අණකරයක් හෝ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ බැංකු ගිණුමක් වෙත මුදල් සම්ප්‍රේෂණය කළ හැක.

**අභිලාශ ප්‍රකාශනය සමඟ පහත ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.**

01. සංස්ථාගත කිරීමේ/ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය
02. සමාගම් ප්‍රොෆයිලය හා ස්වාධීන අධ්‍යක්ෂවරුන්/හිමිකරුවන් ගේ ප්‍රොෆයිලයන්
03. සාංගමික ව්‍යවස්ථාවලිය (ARTICLES OF ASSOCIATION) හෝ සංස්ථාගත කිරීමේ හෝ වෙනත් ඒ සමාන නීතිමය ලිපි ලේඛන ආදිය
04. යාවත් කාලීන කළ VAT බදු ලියාපදිංචි කිරීමේ සහතිකය, වෙළෙඳ බලපත්‍රය හා බදු අනන්‍යතා අංක (TIN) සහතිකය හෝ ඒ සමාන ලියවිලි
05. මූල්‍ය ස්ථාවරභාවය පිළිබඳව පිළිගත් ජාත්‍යන්තර බැංකු සහතිකකරණ නිර්දේශයක් (BANK SOLVENCY CERTIFICATE)
06. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සහතික කළ විගණන වාර්තාවක් (සම්මුතියක් නම් සෑම පාර්ශවයකම විගණන වාර්තා වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය)
07. හවුල් සංධානයක් නම්, සම්මුතිගත නොතාරිස් ගිවිසුමක්

මේ සඳහා කැමැත්තක් දක්වන පාර්ශවයන් සිය **මූල්‍ය යෝජනා සහ අනුග්‍රාහක ලාංඡනය 2022 ජූලි මස 18 වන දින සවස 3.00** ට හෝ ඊට පෙර **sponsorship@srilankacricket.lk** යන ඊමේල් ලිපිනයට යොමු කළ යුතු අතර එම ලිපි ලේඛනයන්හි දෘඩ (Hard Copy) පිටපත් ප්‍රධාන විධායක නිලධාරී, ශ්‍රී ලංකා ක්‍රිකට්, නො. 35 මේට්ලන්ඩ් පෙදෙස, කොළඹ 07 යන ලිපිනයට භාරදිය යුතුය.

මෙම අභිලාශ ප්‍රකාශනයට අදාල වැඩි විස්තර දැනගැනීම සඳහා කරුණාකර 077-9429035 යන දුරකථන අංකයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ව්‍යාපාර සංවර්ධන කළමනාකරු අමතන්න

කිසිදු හේතු ඉදිරිපත් කිරීමකින් තොරව ඕනෑම අවස්ථාවක මෙම අභිලාශ ප්‍රකාශ කිරීම් භාරගැනීමේ, ප්‍රතික්ෂේප කිරීමේ, සංශෝධනය කිරීමේ හෝ වෙනස්කම්වලට භාජනය කිරීමේ පූර්ණ අභිමතය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සතු වේ.

ප්‍රධාන විධායක නිලධාරී, ශ්‍රී ලංකා ක්‍රිකට්, අංක 35, මේට්ලන්ඩ් පෙදෙස, කොළඹ 07


කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 8 දරණ ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2022 ජූලි මස 9 වැනිදා සෙනසුරාදා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.
Lankadeepa - Printed and published by Wijeya Newspapers Ltd. on Saturday 09th July, 2022 at No. 8, Hunupitiya Cross Road, Colombo 02, Sri Lanka.
Telephone: Editorial Dept: 2448321, 2423919, 5330813 Fax: 2438039, Advertising Dept: 2479540, 5383383, 5330330, Fax: 2314864, 2304144 Circulation Dept: 2435454, 2448322, 2479625 Fax: 2459725 General: 2314714